# 2023 ජනවාරි මස මාසික සභා රැස්වීමේ සංශිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2023.01.09**
**වේලාව - පෙ.ව. 10.30**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | චතුමිණී විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVIII. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIX. | පී.එල්. චාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, 1991 වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපති ධූරය දරා මේ වන විට මිය ගොස් ඇති එල්.වයි.එන්. සෙනවිරත්න මහතාත්, 1991 වර්ෂයේ ගරු ප්‍රාදේශීය සභා සභිකයෙකු ලෙසත්, 1997 වර්ෂයේ

ගරු උප සභාපති ධූරයත් දරා මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතාත්, ගරු ප්‍රාදේශීය සභා සභික ඩී.ඩී. ඒකනායක මහතා, හේමසිරි පතිනායක මහතා, ඩබ්.එල්.ජී. ජිනදාස මහතා, පී.ජී. පීරිස් අප්පු මහතාටත්,

1997 වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ධූරය දරා මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතාත්, ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්.කේ. පියසේන මහතාත්, එච්.ජී.ජී. ආරියපාල මහතාටත්,

2018 වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ ගරු ප්‍රාදේශීය සභා සභික ධූරය දරා මේ වන විට මිය ගොස් ඇති එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපතිවරුන්ට සහ ගරු ප්‍රාදේශීය සභා සභිකයින් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිශ්ශබ්දතාවය පළ කරන ලදී.

එසේම අප සභාව 1991 වර්ෂයේ සිට නියෝජනය කරමින් මේ වන විට මියගොස් ඇති මහජන නියෝජිතයින් පිළිබඳ තොරතුරු ගරු උප සභාපති සුදත් විදානගමගේ මහතාගෙන් සහ 1997 වර්ෂයේ සිටි මහජන නියෝජිතයින් පිළිබඳ තොරතුරු ගරු සභික, වාලි ගුණරත්න මහතා යන ජ්‍යෙෂ්ඨ සභිකයින්ගෙන් ලබා ගැනීමට කටයුතු කළ බව මේ අවස්ථාවේ සිහිපත් කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2023 වර්ෂයේ පළමු මහා සභාව පැවැත්වෙන අද දින පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය සහ මාධ්‍යවේදී ඒ.ඒ. ප්‍රේමසිරි මහතාත්, 2023 වසර සඳහා මාසික මහා සභාව සඳහා අලුතින් සහභාගී වූ මාධ්‍යවේදී අසිත මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2022.12.20 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.12.20 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.12.20 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ, ගයාන් සඳරුවන් මතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>සංශෝධන</u>

**01.** <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>

2022.12.20 දිනැති මහා සභා වාර්තාවේ පිටු අංක 38 හි සඳහන් තම අදහස, සියඹලාගස්වැව සහ රුවන් වැව යන වැව් 02 ට ඉහලින් තවත් වැවක් සකස් කර ඇති බැවින්, ගොවි ජනතාවගේ ගොවි බිම් සඳහා ජලය ගෙන යන ජල පෝෂක ප්‍රදේශ ඇහිරී ඇති බවට සංශෝධනය විය යුතුය.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. තිස්සමහාරාම බල ප්‍රදේශයේ සිදු කරනු ලබන ඉඩම් අනුබෙදුම් අනුමත කිරීම, ගොඩනැගිලි සංවර්ධන අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා 2022 වර්ෂයේ දෙසැම්බර් මස දක්වා සැලසුම් කමිටුවට යොමු කරන ලද සැලසුම්පත් ලේඛන ගරු මහා සාබවට ඉදිරි කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

| **2022 දෙසැම්බර් මාසය- සැලසුම් කමිටු වාර්තාව** | | | | |
|---|---|---|---|---|
| අනු අංක | ලි.ප.අ. | නම | අනුමත වීම/නොවීම | කමිටු දිනය |
| 1 | අ/බෙ./2022/110 | නිමල් උපාලි අමරවීර | අනුමත නොවිය | 2022.12.23 |
| 2 | අ/බෙ/2022/92 | සජිත් කෞෂලයා | අනුමත නොවිය | 2022.12.23 |
| 3 | අ/බෙ/2022/100 | අනුර නානායක්කාර | අනුමත විය | 2022.12.13 |

| | | | | |
|---|---|---|---|---|
| 4 | අ/බෙ/2022/104 | එම්.ඩබ්.චිත්‍රලතා | අනුමත වීය | 2022.12.23 |
| 5 | අ/බෙ/2022/105 | ලලන්ත ඉන්ද්‍රප්‍රිය අබේනායක | අනුමත වීය | 2022.12.23 |
| 6 | අ/බෙ/2022/111 | වයි.ජී.සරත් බන්දුල | අනුමත වීය | 2022.12.23 |
| 7 | අ/බෙ/2022/77 | එච්.කේ.ඒ.කසුන් උදාර | අනුමත විය | 2022.12.13 |
| 8 | අ/බෙ/2022/108 | එච්.ටී.තුෂාර | අනුමත නොවිය | 2022.12.13 |
| 9 | අ/බෙ/2022/109 | එම්.පියසේන | අනුමත විය | 2022.12.13 |
| 10 | අ/බෙ/2022/107 | ලාල් රෝහණ එදිරිසූරිය | අනුමත විය | 2022.12.23 |
| 11 | අ/බෙ/2022/106 | පී.ඊ.ගලප්පත්ති | අනුමත විය | 2022.12.23 |
| 12 | අ/බෙ/2022/103 | ජේ.ඒ.පේමාවතී | අනුමත වීය | 2022.12.13 |
| 13 | අ/බෙ/2022/112 | පී.ශ්‍යාමලී එදිරිසූරිය | අනුමත විය | 2022.12.23 |
| 14 | සං/අ/2022/84 | තිළිණ කුලකුලසූරිය | අනුමත නොවිය | 2022.12.23 |
| 15 | සං/අ/2022/88 | ඒ.ආර්.කුරුප්පුආරච්චි | අනු.ස.අනුමත විය | 2022.12.23 |
| 16 | සං/අ/2022/82 | එච්.කේ.ඒ.කසුන් | අනුමත විය | 2022.12.13 |
| 17 | සං/අ/2022/92 | ලලිත් ඉන්ද්‍රපිය අබේනායක | අනුමත විය | 2022.12.23 |
| 18 | සං/අ/2022/94 | ඩබ්.පී.එන්.ප්‍රියදර්ශන | අනුමත විය | 2022.12.23 |
| 19 | සං/අ/2022/86 | ජේ.ඒ.පේමාවතී | අනුමත නොවිය | 2022.12.13 |
| 20 | අ/බෙ/2022/71 | කේ.හරිස්චන්ද්‍ර | අනුමත විය | 2022.12.29 |
| 21 | අ/බෙ/2022/72 | කේ.හරිස්චන්ද්‍ර | අනුමත විය | 2022.12.29 |
| 22 | අ/බෙ/2022/73 | කේ.හරිස්චන්ද්‍ර | අනුමත විය | 2022.12.29 |
| 23 | අ/බෙ/2022/74 | කේ.හරිස්චන්ද්‍ර | අනුමත විය | 2022.12.29 |
| 24 | අ/බෙ/2022/75 | කේ.හරිස්චන්ද්‍ර | අනුමත විය | 2022.12.29 |
| 25 | අ/බෙ/2022/76 | කේ.හරිස්චන්ද්‍ර | අනුමත විය | 2022.12.29 |
| 26 | අ/බෙ/2022/96 | එන්.ඒ.මුතුමාල | අනුමත විය | 2022.12.29 |
| 27 | අ/බෙ/2022/97 | එන්.පී.බී.එම්.කුමාර | අනුමත විය | 2022.12.29 |

II. ප්‍රසම්පාදන ටෙන්ඩර් දැන්වීම පල කිරීම් සිදු කොට තෙවන වරද ටෙන්ඩර් නොවූ පහත සඳහන් දේපළ 02ක සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩලය කැඳවන ලද අතර, එහිදී ටෙන්ඩර් මණ්ඩලය විසින් ලබා ගත් තීරණයන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | බදු විෂයය | අවම ලන්සුව (රු) | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු) | පෝරම් ගාස්තුව (රු) |
|---|---|---|---|---|
| 02 | දෙබරවැව ධීවර වෙළඳසැල | 108,000.00 | 1,000.00 | 500.00 |
| 03 | දෙබරවැව පොදු වෙළඳපොළ ධීවර ගොඩනැගිල්ල | 145,800.00 | 1,000.00 | 500.00 |

1. ඉහත දේපල සඳහා ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර තිබූ අතර දෙබරවැව ධිවර වෙළඳසැල බදු අයිතිය ලබා දෙන ලෙස ලුණුගම්වෙහෙර, දකුණු ඉවුර, මිහුඳුපුර, කු.ග 06, අංක 416/1, ලිපිනයෙහි පදිංචි එම්. ඉන්දික මයා විසින් මාසික බදු කුලිය රු. 5,000.00 ක බදු කුලියකට ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම ටෙන්ඩර් ණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

2. එකී දේපළ 2022 වර්ෂයේද ටෙන්ඩර් නොවූ අතර, මේ හේතුවෙන් සභාවට ලැබෙන ආදායම නොලැබී යාම හේතුවෙන් මෙම දේපළ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර තක්සේරු වාර්තාවට අනුව දීර්ස කාලීන බදු පදනම යටතේ එක්වන් මුදලකට යටත්ව මාසික බදු කුලියකට ලබා දීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය යෝජනා කරන ලදී.

3. ඒ අනුව, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තාව ලැබෙන තෙක් තාවකාලික තක්සේරු වාර්තාවක් ආදායම් පරීක්ෂකගෙන් ලබා ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

4. දෙබරවැව ධීවර ගොඩනැගිල්ල බදු අයිතිය ලබා දෙන ලෙස තිස්සමහාරාම, දෙබරවැව, අංක 452, ඒ.සී.ආර්. මාර්කටින් ලිපිනයෙහි පදිංචි ඒ.සී රාජපක්ෂ මහතා විසින් මාසික කුලිය රු. 6,000.00 කට ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම ටෙන්ඩර් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

5. දැනට සභාවට ආදායමක් ලබා ගැනීම සඳහා රු. 6,000.00 ක මාසික කුලිය ඉල්ලීම් කළ අය වෙත ලබා දීම සුදුසු බවත්, මෙම ගොඩනැගිල්ල ස්වයං රැකියා උත්පාදන ස්ථානයක් ලෙස වැඩි දියුණු කර, තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තක්සේරු කිරීම් සිදු කිරීමෙන් අනතුරුව, එක්වන් මුදලකට යටත්ව දීර්ඝ කාලීන බදු පදනම මත, අදාල ව්‍යාපාර කටයුත්ත සිදු කිරීම සඳහා ලබා දීම සුදුසු බවටත්, ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉහතින් සඳහන් දේපළ තුන්වන වරටත් ටෙන්ඩර් නොවූ නිසා, ඒ සම්බන්ධයෙන් ටෙන්ඩර් මණ්ඩලය රැස් කර ටෙන්ඩර් මණ්ඩලය ලබා දුන් තීරණය අනුව, මේ සඳහා ඉල්ලීම් ලිපි සලකා බලා මෙය ලබා දීමට තීරණය විය. මෙම ගොඩනැගිල්ල සඳහා මාසිකව අය විය යුතු ගාස්තුව මාසිකවම පමණක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. මෙම ගොඩනැගිල්ල මෙසේ භාවිතා කරන අතරතුර යම් කෙනෙකු ටෙන්ඩරය ඉල්ලීම් කළහොත් මෙය නැවත ලබා දීමේ කොන්දේසිය මත ගිවිසුම් ගත වී ලබා දීමට උපදෙස් ලබා දෙන ලදී. එසේම මෙම ගොඩනැගිල්ල ව්‍යාපාරයක් සඳහා ලබා දීමට හැකි නම් එය වඩාත් සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.</u>

✓ වසර 05 පාලන කාලය තුළ මා ඇතුළු ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින් විසින් සිදු කරන්නා වූ කාර්යන් සඳහාත්, අප සම්මත කර දෙන යෝජනා ක්‍රියාවට නැංවීමට ඇප කැප වී සේවය කරන ලද කාර්ය මණ්ඩල සේවකයින් ඇගයීමක් අද දින සිදු කළ යුතු බැවින්, ඒ සඳහා අංශ වශයෙන් නිලධාරීන් ගෙන්වා ඔවුන්ගේ සේවය ඇගයීමට ලක් කර එම සිදු කරන්නා වූ සේවයට ස්තුතිය පුද කිරීම සඳහා අවස්ථාව ලබා ගැනීමට මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ආර්. ඒ. ගයාන් සඳරුවන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

ප්‍රථමයෙන් කාරක සභා අවස්ථාව සඳහා ආයතන අංශය ලෙස අංශ ප්‍රධානි කේ.එන්.පී.ජී. ප්‍රමිලා නදීෂිකා මහත්මිය ඇතුළු එස්.පී.එන්. මධුභාෂිණී මිය, ජේ.කේ.ටී. සඳකැලුම් මිය ද, ගිණුම් අංශය ලෙස අංශ ප්‍රධානි එල්.පී.කේ. චමින්දිකා මහත්මිය ඇතුළු ජේ.ඒ. සමන්මලී මිය, බී.කේ. ධම්මික සම්පත් මයා, එල්.වයි.එස්. සුබෝදිනී මිය, ඩබ්. ප්‍රියන්තිකා මිය, සඳුල්මිණි රිෂ්වණා මෙය, බී.ඒ. සුරේෂි මධුෂාණි මෙනවිය ද, සංවර්ධන අංශය ලෙස අංශ ප්‍රධානි ඩබ්.ඒ. අසංගිකා මහත්මිය ඇතුළු තාක්ෂණ සේවා නිලධාරී එල්.පී. ජගත් කුමාර මහතා, එම්.ඩබ්.පී. චතුරිකා සහ ආර්.කේ. චමිලා මධුවන්ති මහත්මිය ද, ප්‍රජා/පරිසර අංශය ලෙස අංශ ප්‍රධානි ටී.එච්. සචිත්‍රා ප්‍රසාදනී මහත්මිය සහ එම්.ඒ. ගීතාංජලී ධනුෂ්කා මහත්මිය ද, ආදායම් අංශය ලෙස අංශ ප්‍රධානි බී.එල්.පී. රසාංග මහතා ඇතුළු වයි.ජී.එම්. නිරාෂා මිය, කේ.ආර්. දිලංකා ලක්ෂාණි මෙය, නිමේෂා ලක්මාලි මිය, ආදායම් පරීක්ෂක එස්.ඒ. අරුෂි ප්‍රසංගිකා මිය, එස්.කේ.කේ. හිරුණි මලීෂා මිය ද, ආයතනයේ සියලුම ලිපි කටයුතු සහ වාර්තා සකස් කිරීම ආදී කටයුතු සිදු කරන එච්.එම්. දිලිනි සංජීවනී මිය ඇතුළු සියලුම නිලධාරීන් අංශ වශයෙන් වෙන් වෙන් වශයෙන් ගෙන්වමින් රාජ්‍ය සේවකයින් ලෙස ඉතාමත් කැපවීමෙන් හා වගකීමෙන් යුතුව නිවැරදිව විනිවිදභාවයෙන් කටයුතු කිරීම වෙනුවෙන් සහ රාජ්‍ය සේවයට බරක් නොවී තම වගකීම දේවකාරියක් සේ ඉටු කිරීම වෙනුවෙන් සභාපති වන මා ඇතුළු ගරු උප සභාපති, ගරු සභිකයින්ගේ ස්තුතිය පුද කර සිටින ලදී. එසේම මෙම නිලධාරීන් සියලුම දෙනාට දීර්ඝ කාලයක් රාජ්‍ය සේවයේ කටයුතු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

පෙර වසරේ රුපියල් කෝටි 05 ක්ව තිබූ ආදායම රුපියල් කෝටි 22 දක්වා වැඩි කර ගැනීමට කටයුතු කර ඇත. මේ සඳහා දැඩි කැපකිරීමක් ආදායම් පරීක්ෂක නිලධාරී ඇතුළු ආදායම් අංශය ප්‍රධාන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. සභාවේ ආදායම් තත්ත්වය වැඩි කර ගැනීම සඳහාත්, ආයතනයේ විසින් සිදු කරනු ලබන වැඩසටහන් සාර්ථකව සිදු කර ගෙන යාම සඳහාත් මෙම නිලධාරීන් සියලුම දෙනා සතියේ දින 05 ට අමතරව සතිඅන්තයේ සහ සතියේ නිවාඩු දිනවලද සේවයට පැමිණ සිදු කරන්නා වූ සේවයට නැවතත් ස්තුතිය පුද කරන ලදී.

ඉන් අනතුරුව මෙකී සෑම කාර්යයක් සිදු කර ගෙන යාම සඳහා සහාය ලබා දෙන තවත් නිලධාරීන් පිරිසක් ලෙස, වැඩ බලන සෞඛ්‍ය පරිපාලක, චමින්ද කොඩිතුවක්කු මහතාත්, කාර්යාල කාර්ය සහායක ලෙස කටයුතු කරන ආර්.එම්. අසංක රන්දෙණිය මහතාත්, පී.එම්.කේ. සුනිල් ශාන්ත මහතාත්, එච්.ජී.එන්. දයාවංශ මහතාත්, නලීන් ජයවර්ධන මහතාත්, රියදුරු ඩබ්.ඒ. දයාරත්න මහතාත් සිදු කරන්නාවූ සේවයට සභාපති වන මා ඇතුළු ගරු උප සභාපති, ගරු සභිකයින්ගේ ස්තුතිය පුද කර සිටින ලදී. එසේම මෙම නිලධාරීන් සියලුම දෙනාටත් දීර්ඝ කාලයක් රාජ්‍ය සේවයේ කටයුතු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ආයතනයේ නිලධාරීන් සියල්ලම පරිපාලනය කර ගනිමින් ඉතාමත් වගකීමෙන් යුතුව දැඩි කැපවීමක් සිදු කරනු ලබන ආයතනයේ ලේකම්තුමිය වන ඩී. රුවිනා දීපානි මහත්මිය සිදු කරනු ලබන්නේ විශාල සේවාවකි. එතුමිය තිස්සමහාරාම ප්‍රදේශයේ නොවුනත්, සතියේ දින 05 ට අමතරව සති අන්තයේ සහ සතියේ නිවාඩු දිනවලද සේවයට පැමිණ සභාවෙන් ඉටු විය යුතු සේවාවන් සොයා බලා ඉටු කර දීමට කටයුතු කර ඇත. එසේම නිලධාරීන් කළමනාකරණය කර ගනිමින් නිවැරදිව කටයුතු කිරීම වෙනුවෙන් සහ ගරු සභිකයින් ඉල්ලීම් කරන සෑම දෙයක්ම ඉටු කර දීමට ගනු ලබන උත්සාහය වෙනුවෙන් එතුමියට විශේෂ ස්තුතියක් පුද කළ යුතුය. එසේම ලේකම්තුමිය නිවැරදිව කටයුතු කරන නිසා, අප මහජන නියෝජිතයින් 23 දෙනාට එලියට යාමට සිදු වුවත්, එතුමියට සභාවේ කටයුතු අද සේම ඉදිරියටත් නිවැරදිව සිදු කර ගෙන යාමට හැකි වනු ඇත. එතුමිය විසින් රාජ්‍ය සේවය සිදු කරන්නා වූ මහඟු සේවය වෙනුවෙන් එතුමියට ගෞරවය පුද කළ යුතුය. එසේම, රාජ්‍ය නිලධාරියෙක් ලෙස ඉතාමත් කැපවීමෙන් හා වගකීමෙන් යුතුව නිවැරදිව විනිවිදභාවයෙන් කටයුතු කිරීම වෙනුවෙන් සහ රාජ්‍ය සේවයට බරක් නොවී තම වගකීම දේවකාරියක් සේ ඉටු කිරීම වෙනුවෙන් සභාපති වන මා ඇතුළු ගරු උප සභාපති, ගරු සභිකයින්ගේ ගෞරවණීය ස්තුතිය පුද කර සිටින ලදී. එසේම ලේකම්තුමියට දීර්ඝ කාලයක් රාජ්‍ය සේවයේ කටයුතු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

එසේම අද දින මහා සභාවට ගෙන්වීමට නොහැකි වුවත්, ආයතනයේ ආයුර්වේද මධ්‍යස්ථාන නිලධාරීන්, පුස්තකාල නිලධාරීන්, පෙර පාසල් ගුරුවරුන්, ආදාහනාගාර, කොම්පෝස්ට් මධ්‍යස්ථාන නිලධාරීන්, රියදුරු මහතුන්, සෞඛ්‍ය/මාර්ග අංශයේ සේවක මහත්ම මහත්මීන් සිදු කරන්නාවූ සේවයත් අගය කරන අතර, එම සියලුම දෙනාටත් ස්තුතිය පුද කර සිටින ලදී. එසේම ඔවුන් විසින් සිදු කරන්නාවූ සේවයට සභාපති වන මා ඇතුළු ගරු උප සභාපති, ගරු සභිකයින්ගේ ස්තුතිය පුද කර සිටින ලදී. එසේම මෙම නිලධාරීන් සියලුම දෙනාටත් දීර්ඝ කාලයක් රාජ්‍ය සේවයේ කටයුතු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

- ✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ආර්. ඒ. ගයාන් සඳරුවන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>**

01. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර සඳහා 37.5 Kg ගෑස් සිලින්ඩර් 09 ක් මිලදී ගැනීම වෙනුවෙන් බිල් අංක 286378 යටතේ රු. 167,850.00 ක මුදල සෝමසිරි ස්ටෝර්ස් (අගුණුකොළපැලැස්ස) වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. හිඟ වරිපනම් ආදායම් අය කිරීම් සම්බන්ධව ආයතනයේ පහත නිළධාරීන් ක්ෂේත්‍රයේ යෙදවීමට සහ එම නිලධාරීන්ට මසකට හිඟ වරිපනම් මුදල් රු. 30,000.00 ක ඉලක්කයක් ලබා දී, එම ඉලක්කය සම්පූර්ණ කරන නිලධාරීන් සඳහා 10% ක කොමිස් මුදලක් ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බී.එල්.පී.පුබුදු රසාංග මයා
2. ඒ.එම්.ගීතාංජලී ධනුෂ්කා මිය
3. ටී.එච්.සචිත්‍රා ප්‍රසාදිනී මිය
4. වයි.ජී.එම්.නිරාෂා මිය
5. නිමේෂා ලක්මාලි මිය
6. එල්.වයි.සුමංගලා සුබෝධනී මිය
7. එම්.සඳුල්මිණි රිෂ්වනා මෙනවිය
8. එස්.පී.එන්.නදීකා මධුභාෂිණී මිය
9. ආර්.චමිලා මධුවන්ති මිය
10. පී.එම්.කේ.සුනිල් ශාන්ත මයා

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. 2022 වර්ෂයේ තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවේ ටෙන්ඩර් දේපළ ලබා ගැනීමේදී තැම්පත් කරන ලද 25% ආරක්ෂිත ඇප තැම්පතු හා ටෙන්ඩර් තැම්පතු නිදහස් කර අදාළ ආදායකයන් හට ගෙවීමට හා 2022 වර්ෂයේ දී ටෙන්ඩර් දේපළවල හිඟ වාරිකව පැවති ටෙන්ඩර් අයදුම්කරුවන්ගේ ඇප තැම්පතු ඔවුන්ගේ ඉල්ලීම මත, හිඟ වාරික මුදල් අය කර ගැනීම සඳහා මෙම ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | නම | 12/31/2022 හිඟය | 25% ආරක්ෂිත ඇප | හිඟ | අදායකයාට ගෙවිය යුතු මුදල |
|---|---|---|---|---|---|
| 1 | ජී.කේ මහේෂ් සමීර | 349,855.00 | 301,927.50 | 47,927.50 | |
| 2 | නලගමගේ කීර්තිරත්න | 625,000.00 | 376,750.50 | 248,249.50 | |
| 3 | වි.ඒ.රංජිත් | 699,909.10 | 476,250.00 | 223,659.10 | |
| 4 | ඉෂාර ගයාෂාන් | 289,264.50 | 123,970.50 | 165,294.00 | |
| 5 | දිලුම් තාරක වෙරගොඩ ආරච්චි | 41,562.44 | 41,425.00 | 137.44 | |
| 6 | කරුපයියා වේලු | 0.00 | 27,000.00 | -27,000.00 | 27000 |
| 7 | කරුපන් ඉන්ද්‍රාණි | 22,987.00 | | 22,987.00 | |
| 8 | කරුපයියා වේලු | 0.00 | 3,812.50 | -3,812.50 | 3812.5 |
| 9 | පි.ඒ ගාමිණි | 0.00 | 975.00 | -975.00 | 975 |
| 10 | වි.ඒ.රංජිත් | 22,500.00 | 11,250.00 | 11,250.00 | 0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | වැල්ලහේනගේ සිරිසේන | 0.00 | 2,010.00 | -2,010.00 | 2010 |
| 12 | කේ අබේනායක | 0.00 | 922.50 | -922.50 | 922.5 |
| | | | | 0.00 | |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. 2023 වර්ෂය සඳහා තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවේ ටෙන්ඩර් දේපළ ලබා ගැනීමේදී තැම්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැම්පතු නිදහස් කර අදාළ ආදායකයන් හට ගෙවීමට හා 2022 වර්ෂයේ දී ටෙන්ඩර් දේපළවල හිඟ වාරිකව පැවති ටෙන්ඩර් අයදුම්කරුවන්ගේ ඇප තැම්පතු ඔවුන්ගේ ඉල්ලීම මත, හිඟ වාරික මුදල් අය කර ගැනීම සඳහා මෙම ගරු මහා සභාවට යෝජනා කරමි.

| නම | ල .අ හා දිනය | මුදල |
|---|---|---|
| නලගමගේ කීර්තිරත්න | 33096<br>2022/10/13 | 50,000.00 |
| විදාන ආරච්චිගේ රංජිත් | 33461<br>2022/11/09 | 50,000.00 |
| එදිරිවර්ණ පටබැඳිගේ ටමේෂ් නිර්මාල් | 33927<br>2022/12/02 | 10,000.00 |
| ඩබ්.ඒ. පසිඳු වර්ණ කුමාර | 33079/<br>2022/10/12 | 5,000.00 |
| කේ.ආර්. ජනිතා ලක්ෂ්මි | 33094<br>2022/10/13 | 5,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චතුමිණි විජේනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. 2021 වර්ෂයේ ටෙන්ඩර් ලබා දී ඇති තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවට අයත් පන්නගමුව පොදු වෙළඳපොළ හා දෙබරවැව පොදු වෙළඳපොළ ආදායම් පරීක්ෂක වාර්තා හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පැවති කමිටුවේ වාර්තා වලට අනුව ඔක්තෝබර් , නොවැම්බර් මාස සඳහා පොළ පාර දෙපස පැවැත්වීම හේතුවෙන් සම්පූර්ණ බදු වාරික මුදල සඳහා බදු සහන ලබා දීමටත්, දෙසැම්බර් මාසයේදී පොළ සඳහා වෙළඳුන්ගේ පැමිණීම අඩු වීම මත 50% ක බදු සහනයක් ලබා දීමටත් සුදුසු බව ගරු මහා සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. පහත සඳහන් ඇස්තමේන්තු සඳහා නිර්දේශය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කර්මාන්තයේ නම | මුදල |
|---|---|---|
| 1 | කොරගහඋල්පත සෙනෙවිරාජ ගමට පිවිසෙන මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීම | 435397.63 |
| 2 | කොරගහඋල්පත සිට පොත්තවල මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීම | 361961.00 |
| 3 | ගොවියා දෙවියා මාවත මෝටර් ග්‍රේඩර් කිරීම | 110732.50 |
| 4 | පුස්තෝලමුල්ල ට්‍රාන්ස්ෆෝමර් මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීම | 251228.50 |

| | | |
|---|---|---|
| 5 | නිරාවල කනත්ත මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීම | 432553.50 |
| 6 | රන්තරු මාවත මෝටර් ග්‍රේඩර් කිරීම | 188421.38 |
| 7 | පරණ සූරිය ඉඩම මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීම | 472639.50 |
| 8 | අකුරුගොඩ උසාවිය අසල රථවාහන නැවතුම්පොළ වටකර කම්බි වැට ගැසීම | 149105.00 |
| 9 | කාවන්තිස්සපුර තුරුසෙවණ දැන්වීම් පුවරු සකස් කිරීම | 26600.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථාන වල පිහිටි කඩ කාමරයේ බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාව වෙත යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | කඩ කාමර අංකය | දැනට බදු අයිතිය | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|---|
| 1 | තිස්සමහාරාම පොදු වෙළඳපොළ කඩ කාමර | 52 | ජී.ආර්. තරංග සංජීව කුමාර | එම්.එච්.ගයනි නිසංසලා | ස්වාමියාගෙන් බිරිඳට |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් විශ්‍රාම යාම, සේවය අතහැර යාම මත පවතින පහත පුරප්පාඩු සඳහා දෛනික පදනමින් සේවකයන් බඳවා ගැනීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

| තනතුර | අනුමත සංඛ්‍යාව | ස්ථිර | පුරප්පාඩු |
|---|---|---|---|
| ඖෂධ සංයෝජක | 02 | 01 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 02 | 01 | 01 |
| මුරකරු | 02 | 01 | 01 |
| පුස්තකාල සහායක | 02 | 01 | 01 |
| ආදාහනාගාර සහායක | 01 | 00 | 01 |
| ක්‍රීඩාපිටි භාරකරු | 01 | 00 | 01 |
| රියදුරු | 12 | 06 | 06 |
| සෞඛ්‍ය කම්කරු | 24 | 20 | 04 |
| වැඩ ක්ෂේත්‍ර කම්කරු | 15 | 07 | 08 |
| කොම්පෝස්ට් කම්කරු | 06 | 02 | 04 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**
- **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

09. පන්නෙගමුව අංජලිගල ගල්රූන මාවත අලුත්වැඩියා කිරීමේ දී ඉතා අත්‍යාවශ්‍ය ස්ථාන සඳහා ඇතිරීම වෙනුවෙන් අඩි 1- 6 ප්‍රමාණයේ විෂ්කම්භයෙන් යුත් හියුම් පයිප්ප 07 ක් මිලදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චතුමිණි විජේනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන පෙර පසාල් 06 ට අමතරව පෙර පාසල් 10 ක් සභාව වෙත පවරා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය හිමි වී ඇති බැවින්, එම සියළුම පෙර පාසල්වල දරුවන් සඳහා නිල ඇඳුම් ලබා දීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

ගරු සභාපතිතුමාගේ සංකල්පයක් අනුවත්, තිස්සමහාරාමය වෙනුවෙන් ගනු ලැබූ ඓතිහාසික තීරණයක් ලෙසත් සභාව සඳහා තවත් පෙර පාසල් 10 ක් පවරා ගැනීමට කටයුතු කිරීම සඳහන් කළ හැකිය. සභාවට පවරා ගන්නා ලද පෙර පාසල් 10 මේ වන විටත් හදුනා ගනිමින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. පෙර පාසල් මාර්තු මාසය තුළ ආරම්භ කිරීමට නියමිත බැවින්, පෙර පාසල් ආරම්භ කිරීමට දිනයන් යොදා ගෙන ඇත්ද යන්න විමසීම් කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>

පුල්පල්ලම ප්‍රදේශයේ අලුතින් ආරම්භ කරනු ලබන පෙර පාසල සඳහා ළමුන් බදවා ගැනීමේ දී කොන්දේසි මාලාවක් පවතීද යන්න විමසීම් කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>පෙර පාසල් ආරම්භ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් ලබා ගෙන ආරම්භ කරන දිනයක් තීරණය කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>පෙර පාසල සඳහා ඇතුළත් කළ හැකි වයස් සීමාව සම්පූර්ණ වී ඇත්නම් පෙර පාසල් සඳහා ළමුන් බදවා ගත හැක. පුල්පල්ලම පෙර පාසල සඳහා ළමුන් බදවා ගත හැක්කේ 100 ක් පමණි. අයදුම්පත් ලබා දීමේ කාර්යය ද ගරු උප සභාපතිතුමා භාර නොගෙන, ග්‍රාම නිලධාරී හරහා ලබා දීමට කටයුතු කර ඇත. දැනට අයදුම්පත් 76 ක් නිකුත් කර ඇති බැවින්, තවත් ළමුන් ඇතුළත් කිරීමට ඇත්නම් ග්‍රාම නිලධාරී හරහා අයදුම්පත් ලබා ගන්නා ලෙසට දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී පී.එන්. මධුෂානි මහත්මිය පෞද්ගලික හේතු මත විදේශ නිවාඩුවක් අයදුම් කර ඇති බැවින්, එතුමියගේ අනුප්‍රාප්තිකයා ලෙස තිස්සමහාරාම ආයුර්වේද මධ්‍යස්ථානයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී එම්.එල්.ඩී.පී. කුමාරි මහත්මිය සතියකට දින 02 ක් (බ්‍රහස්පතින්දා, සිකුරාදා) සේවයේ යෙදවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් මාර්ග ආලෝකකරණයට සවිකර ඇති විදුලිපහන් බොහොමයක් මෙවන විට අක්‍රීය තත්ත්වයේ පවතින බැවින් ඒවා අළුත්වැඩියා කිරීමට පහත සඳහන් විදුලි උපාංග මිළට හා ගෙවීම් කිරීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

01. 50 w LED CHIP - 50
02. LED 50 w Condenser - 50
03. 150 w LED Flash light - 36

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. මාගම ප්‍රජා මණ්ඩලය ලිපියක් මගින්, තිස්සමහාරාම මාගම කොට්ඨාසයේ මාගම අක්කර 18 හන්දියේ සිට කිරින්ද විහාරස්ථානය දක්වා මාර්ගය සකස් කර අවසන් වී ඇති බැවින්, එම මාර්ගය මාගම ප්‍රදේශයේ ජීවත් වු හිටපු ප්‍රාදේශීය සභා උප සභාපති (1991 සිට 2000 දක්වා) සහ ගනික ගුරු උපදේශකවරයෙකු වු ඩබ්.කේ. ප්‍රේමදාස මහතා (නැසී ගිය) නමින් නම් කිරීමටත්, මාගම අක්කර 18 හන්දියේ සහ කිරින්ද විහාරස්ථානය අසල මාර්ගයේ නම් සඳහන් පුවරු 02 ක් සවි කර දෙන මෙන් කරන ලද ඉල්ලීම අනුව, මාගම අක්කර 18 හන්දියේ සිට කිරින්ද විහාරස්ථානය දක්වා මාර්ගය ඩබ්.කේ. ප්‍රේමදාස මහතා නමින් නම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, චාලි ගුණරත්න මහතා</u>

දීර්ඝ කාලයක් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව නියෝජනය කරමින් ජනතාවට මහඟු සේවයක් කළ ජ්‍යෙෂ්ඨ මහජන නියෝජිතයෙක් ලෙසත් කාලයක් ගරු උප සභපති ධූරය දරමින් කටයුතු කළ ඩබ්.කේ. ප්‍රේමදාස මහතා නමින් මෙම මාර්ගය නම් කිරීම වඩාත් සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මිය</u>

දේශපාලන දිවියට වඩා ඩබ්.කේ. ප්‍රේමදාස මහතා ගුරුවරයෙක් ලෙස දරු පරපුර සඳහා මහඟු සේවයක් සිදු කර ඇත. එතුමන් සිදු කළ සේවාවන් වෙනුවෙන් තුති පුදුමක් ලෙස මෙම මාර්ගය එතුමාගේ නමින් නම් කිරීමට කටයුතු කිරීම සතුටට කරුණකි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

14. ජුල්පල්ලම කන්දේ විහාරය විහාරාධිපති පූජ්‍ය කුඩාපාන ගුණානන්ද නායක ස්වාමීන් වහන්සේ, කාවන්තිස්සපුර ශ්‍රී මහා බෝධිරාජාරාම විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ, කාවන්තිස්සපුර ප්‍රජා කමිටුවේ සභාපති සනත් කොඩිකාර මහතා විසින් ලබා දී ඇති ලිපි මගින්, 2014 වර්ෂයේ දී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ උප සභාපතිතුමාගේ මැදිහත්වීම මත, ඔහුගේ ඥාතිවරයෙකුට අයත් ඉඩමක් සභාවට පවරා දී, ජුල්පල්ලම සිඟිති අසපුව පෙර පාසල මධ්‍යම රජයේ රු. 5,000,000.00 ක පමණ ප්‍රතිපාදන මත ඉදි කරන ලද බවත්, අඩු ආදායම් ලාභී පවුල් විශාල ප්‍රමාණයක් ජීවත් වන කාවන්තිස්සපුර කොට්ඨාසයට මෙම පෙර පාසල ඉදි කිරීම සම්පතක් වන අතර, පුරා වසර 31 ක් කාවන්තිස්සපුර කොට්ඨාසයේ සංවර්ධනයේ නියමුවා වු උප සභාපතිතුමා සිදු කරන්නාවු සේවාව අගයමින් සහ ජුල්පල්ලම සිඟිති අසපු පෙර පාසල සඳහා ඉඩම් කොටසක් ලබා දීමට දායකත්වය දැරූ ඔහුගේ ඥාතිවරයාටද ගෞරවයක් පිණිස ජුල්පල්ලම සිඟිති අසපුව පෙර පාසල ''විදානගමගේ සිඟිති අසපුව'' නමින් නම් කරන ලෙසට කරන ලද ඉල්ලීම අනුව, ජුල්පල්ලම සිඟිති අසපුව පෙර පාසල ''විදානගමගේ සිඟිති අසපුව'' නමින් නම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

ගරු උප සභාපතිතුමාගේ මැදිහත්වීම මත, ඔහුගේ ඥාතිවරයෙකුට අයත් ඉඩමක් පරිත්‍යාගය සභාවට ලැබුණු සම්පතකි. ජුල්පල්ලම ප්‍රදේශයේ විශාල වශයෙන් අඩු ආදායම්ලාභී පවුල් සිටී. එම පවුල්වල දරුවන් සඳහා මූලික අධ්‍යාපනය ලබා දීමට තෝතැන්නක් ලබා දී සිදු කරනු ලද්දේ මහඟු පුණ්‍යකර්මයකි. ගරු උප සභාපතිතුමාගේ දැඩි මැදිහත්වීම මත, ඉදි කරන ලද ජුල්පල්ලම පෙර පාසල සඳහා විදානගමගේ සිඟිති අසපුව නමින් නම් කිරීමට කිසිදු අයෙකු විරුද්ධ නොවනු ඇත. පුරා වසර 31 ක් කාවන්තිස්සපුර කොට්ඨාසයේ සංවර්ධනයේ නියමුවා වු උප සභාපතිතුමා සිදු කරන්නාවු සේවාව අගයමිනුත්, ගරු උප සභාපතිතුමාගේ මැදිහත්වීම මත සභාවට අලුතින් වත්කමක් එක් කිරීමට කටයුතු කිරීම වෙනුවෙනුත් ජුල්පල්ලම පෙර පාසල සඳහා විදානගමගේ සිඟිති අසපුව නමින් නම් කිරීම සුදුසු බවට මා ද යෝජනා කරන අතර, ඒ සඳහා නිවාස කමිටුවේ සභාපති වන මාගේ ස්තූතියත්, නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවේ ස්තූතිය ද මෙයින් පුද කර සිටිමි.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා</u>

ගරු උප සභාපතිතුමා සභාවට වත්කමක් එක් කරමින් මහඟු සේවයක් සිදු කර ඇත. එතුමා ඉදිරියේ සමාජ සේවයෙන් සමු ගන්නා පුවත කණගාටුවට කරුණකි. එතුමා ජනතාව වෙනුවෙන් සේවාවන් ඉටු කිරීමට ඇප කැප වී කටයුතු කරන නියෝජිතයෙකි. කාවන්තිස්සපුර කොට්ඨාසය යනු ඉතාමත් දිළිඳු පුද්ගලයින් සිටින හේන් ගොවිතැනින් ජීවත් වන පිරිසක් සිටින ප්‍රදේශයකි. එම ප්‍රදේශයේ සංවර්ධනයේ නියමුවා ලෙස ජනතාව වෙනුවෙන් සේවාවන් රැසක් ඉටු කර දී ඇත. එම සේවාවන් අතරින් එම ප්‍රදේශයට කළ සුවිශේෂී සේවාවක් ලෙස ගරු උප සභාපතිතුමාගේ මැදිහත්වීම මත, ඔහුගේ ඥාතිවරයෙකුට අයත් ඉඩමක් පරිත්‍යාගයක් ලෙස ලබා ගනිමින් ප්‍රදේශයේ දිළිඳු දරුවන්ගේ මුල් ළමාවිය සඳහා යොදා ගැනීමට කටයුතු කිරීමම එතුමා සිදු කළ මහත් වූ සේවාවකි. දරුවන්ගේ සාක්ෂරතාවයේ මුල් අඩියර ලෙස පෙර පාසල් අධ්‍යාපනය මගින් නැණ ගුණපෑදීම සඳහා ගන්නා ලදදේ ඉතාමත් හොඳ තීරණයකි. තිස්සමහාරාම බල ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 44 හි මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 46 ක්, ග්‍රාමීය ආදර්ශ පෙර පාසල් 02 ක් සකස් කිරීම සඳහා මා ද කටයුතු කර එමගින් අත්දැකීම් රැසක් ලබා ගෙන ඇත. පැලවිණි වැටටක් ගහ මරා ගන්නා යුගයක අක්කර 02 ක ඉඩමක් ගරු උප සභාපතිතුමාගේ මැදිහත්වීම මත ඥාතිවරයෙකුගෙන් ලබා ගෙන සිදු කරන ලද්දේ මහත් වූ පුන්‍යකර්මයකි. මෙම පුන්‍යකර්මය ඉතාමත් සතුටු විය හැකි කරුණකි. ගරු උප සභාපතිතුමා පරහිතකාමී කටයුත්තක් සඳහා උර දුන් පුද්ලයෙක් ලෙස සඳහන් කළ හැකිය. එතුමාත්, එතුමාගේ පවුලේ අයද මෙලෙස පුණ්‍යකර්මයක් සිදු කර, දරුවන්ගේ නැණ ගුණ පෑදීමට පෙර පාසල් ඉදි කිරීමට කටයුතු කිරීම දේශපාලනය දිවියේම එතුමා සිදු කරන ලද මහඟු සේවයක් ලෙස සඳහන් කළ යුතුය.

මෙලෙස මා ද දරුවන්ගේ නැණ ගුණ පැදීම සඳහා අවස්ථාව ලබා දීම වෙනුවෙන්, උඩුවිල ප්‍රදේශයේ මාගේ මුත්තනුවන්ගේ මිත්තනියගේ ඉඩමක් වන මාගේ මහ ගෙදර ඉඩමෙහි පෙර පාසලක් සාදා දරුවන් වෙනුවෙන් ලබා දී ඇත. මා සිදු කරන ලද එම ක්‍රියාව සිහිපත් කරමින් අදටත් මා සතුටක් ලබයි.

සභිකයෙකු ලෙස සහ විපක්ෂයක් ලෙස ගරු උප සභාපතිතුමා ජනතාව වෙනුවෙන් සිදු කරන්නාවූ සේවාව වෙනුවෙන් නිහතමානීව සතුටු වන බවත්, ඒ සඳහා මා ඇතුළු මාගේ කණ්ඩායමේ ප්‍රණාමයද පුද කර සිටින ලදී.

ගරු උප සභාපතිතුමා නැවත මැතිවරණයක් සඳහා පෙනී නොසිටිනවා යන කරුණ ඇසූ පසු සිත මොහොතකට සසල විය. එතුමාට තවත් බොහෝ සේවාවන් ජනතාව වෙනුවෙන් කිරීමට තිබියදී මෙසේ දේශපාලනයෙන් සමු ගැනීම දුකට කරුණකි. එතුමා නැවත දේශපාලනය සිදු නොකළත්, තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් ඉදිරියටත් සේවාවන් රැසක් කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී. එතුමාට දීර්ඝායුෂ සහ නීරෝගී සුවය ප්‍රාර්ථනා කරමි. එසේම දරුවන්ගේ නැණ ගුණ පෑදීම සඳහා සිදු කරන ලද මහඟු සේවයට විදානගමගේ පවුලට සුභාශිංසන පුද කරන ලදී.

ගරු උප සභාපතිතුමාගේ මැදිහත්වීම ඉදි කරන ලද ජුල්පල්ලම පෙර පාසල, විදානගමගේ සිහිති අසපුව නමින් නම් කිරීම සුදුසු බවට මා ද යෝජනා කරන අතර, සභිකයෙකු ලෙස සහ විපක්ෂයක් ලෙස ගරු උප සභාපතිතුමා ජනතාව වෙනුවෙන් සිදු කරන්නාවූ සේවාව වෙනුවෙන් නිහතමානීව සතුටු වන බවත්, ඒ සඳහා මා ඇතුළු මාගේ කණ්ඩායමේ ප්‍රණාමයද පුද කර සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. සිසිර කුමාර මහතා</u>

ගරු උප සභාපතිතුමා දේශපාලනය දිවියෙන් සමු ගැනීමේ වදනය මා ඇසූ දුකට කරුණකි. එතුමා මේ දක්වාම නව සභිකයෙක් වූ අප හට උපදෙස් ලබා දෙමින් අප නිවැරදි ගමනක් සඳහා ගෙන යන ලදී. කාවන්තිස්සපුර කොට්ඨාසය තුළ අවුරුදු 31 ක් පුරාවට සිදු කරන ලද සේවය මහ මෙරකි. එතුමා මෙලෙස දීර්ඝ කාලයක් දේශපාලනයේ හිද දිළිඳු ජනතාවගේ දරුවන් වෙනුවෙන් පෙර පාසල් ඉදි කිරීමට කටයුතු කර ඇති බැවින්, එම පෙර පාසල් සඳහා විදානගමගේ නම යෙදීම සම්බන්ධයෙන් කිසිදු අයෙකු විරුද්ධ නොවනු ඇත.

ගරු උප සභාපතිතුමාගේ මැදිහත්වීම මත ඉදි කරන ලද ජුල්පල්ලම පෙර පාසල, විදානගමගේ සිහිති අසපුව නමින් නම් කිරීම සුදුසු බව මා යෝජනා කරන අතර, එතුමා සිදු කළ එම උත්තරීතර ජනතාවාදි සේවාවට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ජුල්පල්ලම පෙර පාසල ඉදි කිරීම සඳහා සහ ඊට යාබදව තුරු උයනක් සකස් කිරීම සඳහා ගරු උප සභාපතිතුමාගේ මැදිහත්වීම මත තම ඥාතිවරයෙකුගේ අක්කර 02 ක ඉඩමක් පරිත්‍යාග ලෙස ලබා ගෙන ඇත. මෙම පෙර පාසල වැඩ 2013 වර්ෂයේ ආරම්භ කිරීමට කටයුතු කළ අතර, ඒ සඳහා ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා, ගරු එස්.වී.පී. ආනන්ද මැතිතුමා වෙතින් ලබා ගත් ප්‍රතිපාදන මත ඉදි කිරීම් කටයුතු සිදු කර සභාවට පරිත්‍යාගයක් ලෙස මෙම වත්කම ලබා දී ඇත. ගරු උප සභාපතිතුමාගේ මැදිහත්වීම මත මෙලෙස වත්කමක් සභාවට පරිත්‍යාගයක් ලෙස ලබා ගැනීමට කටයුතු කිරීම එතුමා කළ මහඟු සේවයකි. එතුමා කළ එම පුණ්‍යකර්මයටත්, දේශපාලන නායකයින්ගෙන් ප්‍රතිපාදන ලබා ගෙන පෙර පාසලේ ඉදිකිරීම් කටයුතු ගරු උප සභාපතිතුමා මැදිහත් වී සිදු කිරීම වෙනුවෙනුත්, කාවන්තිස්සපුර ශ්‍රී මහා බෝධිරාජාරාම විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ සහ ජුල්පල්ලම කන්දේ විහාරය විහාරාධිපති පූජ්‍ය කුඩාපාන ගුණානන්ද නායක ස්වාමීන් වහන්සේ ද ලිපි මගින්, මෙලෙස සිදු කළ උතුම් සේවයට උපහාර දැක්වීමක් ලෙස ජුල්පල්ලම පෙර පාසල සඳහා විදානගමගේ සිඟිති අසපුව නමින් නම් කරන ලෙසට කරන ලද ඉල්ලීම ද සලකා බලා, ජුල්පල්ලම පෙර පාසල විදානගමගේ සිඟිති අසපුව නමින් නම් කිරීමට මහා සභාවේ එකඟතාවය ලබා දෙන ලදී.</u>

<u>ගරු උප සභාපතිතුමාගේ මැදිහත්වීම මත සභාවට අලුතින් වත්කමක් එක් කිරීමට මැදිහත්වී කටයුතු කිරීම වෙනුවෙනුත්, ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස මාගේ විශේෂ ස්තුතිය එතුමන්ට පුද කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ගල් කොරිය සහ ගල් ක්‍රෂර් මධ්‍යස්ථානය සම්බන්ධ වියදම් හා ආදායම් වාර්තාව සහා අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- 2006 වර්ෂයේ ජූලි මාසයේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.
- ව්‍යාපෘතිය ආරම්භ කිරීමට
  1.ප්‍රාග්ධන අවශ්‍යතාවය - රු.2365000.00
  2.ආදායම්(මාසික) - රු. 618500.00
  3.වියදම්(මාසික) - රු. 336250.00
  4. අපේක්ෂිත ලාභය - රු. 282250.00
- 2006 විමධ්‍යගත අයවැය යටතේ මුදල් ප්‍රතිපාදන
  හ/තොට දිස් පාර්ලිමේන්තු මන්ත්‍රී
  1. නිහාල් ගලප්පත්ති මැතිතුමා - රු. 423800.00
  2. විජිත රණවීර මැතිතුමා - රු. 750000.00
  3. වසන්ත රණවීර මැතිතුමා - <u>රු. 776000.00</u>
  <u>රු.1949800.00</u>
- ගෙවීම් කටයුතු - 2006/12/29 දිනට
  I බිල්පත - 473666.00
  II බිල්පත - <u>1320590.00</u>
  එකතුව - <u>1794256.00</u>
- 2006.12.31 දක්වා ගෙවීම් - රු.630474.00
- 2007.08.21 දක්වා ගෙවීම් - රු.399534.00
- මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගෙන නොමැත.
- 2007 වර්ෂයේ අගෝස්තු මස 21 දිනෙන් පසු අදාළ ගොනුව යාවත්කාලීන වී නොමැත.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>ගල් ක්‍රෂර් මධ්‍යස්ථානය සම්බන්ධයෙන් 2007 න් පසු ලේඛන කිසිවක් යාවත්කාලීන කර නොමැත. යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නේ නම්, එය ක්‍රියාත්මක කිරීමට පෙර එම ව්‍යාපෘතිය සම්බන්ධ ව්‍යාපෘති වාර්තා සකස් කර, සක්‍යතා වාර්තා ලබා ගත යුතුය. මෙම ව්‍යාපෘතියට අදාළ කටයුතු විධිමත්ව සිදු නොකිරීම නිසා පරිසර බලපත්‍රය ලබා ගත නොහැක. මෙම ව්‍යාපෘතිය ඌන ව්‍යාපෘතියක් නොවන බවත්, කිසිදු සැලසුමක් අනුව සකස් කර ඇති කර ව්‍යාපෘතියක් ලෙසත් පෙන්වා දිය හැකි බව සඳහන් කරන ලදී.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>**

ගල් ක්‍රෂර් ව්‍යාපෘතියට අදාළ කටයුතු සිදු කිරීමේ දී ඒ සඳහා ගලක් සොයා ගැනීම, විදුලිය ලබා ගැනීම, බලපත්‍රය ලබා ගැනීම ආදී කටයුතු සිදු කිරීම සඳහා සැලසුම් සකස් කරමින් තිබියදී, ඒ අතර කොමසාරිස් පාලනයට සභාව ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අදාළ සැලසුම් අප පාලන කාලයේ සකස් කර තිබුණද, කොමසාරිස් පාලනයට ගත් පසුව, එම ව්‍යාපෘතියට අදාළ ඉදිරි කටයුතු සිදු කර නොමැත. පරිසර බලපත්‍රය ලබා ගැනීමට ද අවශ්‍ය කටයුතු සිදු කර තිබුණි. නමුත් අප එම ව්‍යාපෘතියට අදාළ සියලුම කටයුතු කිරීමට සැලසුම් කර තිබුණද, එම කිසිවක් ලේඛනවල නොතිබීම එම කාලයේ සිටි පරිපාලනයේ පැවැති අඩුපාඩුවක් බව සඳහන් කළ යුතුය.

✓ මේ සම්බන්ධ වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ඒ.පී. ධම්මික මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව

කාරක සභා අවසථාවේ ලේකම්තුමිය විසින් ගල් ක්‍රෂර් මධ්‍යස්ථානයට අයත් ලිපි ගොණුවේ පවතින ලිපි ලේඛන සම්බන්ධව පැහැදිලි කිරීමක් සිදු කරන අතර, 2007 වර්ෂයෙන් පසුව එම ලේඛන යාවත්කාලීන කර නොමැති බවත් දන්වා සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා</u>**

අප පාලන කාලය තුළ කිසිදු ණය මුදලක් නොගෙන, සභාවේ කටයුතු සිදු කර ගෙන යන ලදී. නමුත් 2011 වර්ෂයේ පාලනය භාර ගැනීමේ දී විශාල ණය මුදල් ලබා ගෙන තිබුණු නිසා, එම මුදල් ද ගෙවීමට සිදු වුයේ 2011 වර්ෂයේ පාලනය භාර ගත් පාලන පක්ෂය සඳහාය. 2000 වර්ෂයේ සිට මේ දක්වා සභාවක් ලෙස ලබා ගෙන ඇති ණය මුදල් මොනවාද? කොපමණ ණය මුදල් ලබා ගෙන ඇත්ද යන්නත්, ඊට අදාළ තොරතුරු ලබා දෙන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>ගල් ක්‍රෂර් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2007 න් පසුව ලේඛන කිසිවක් නඩත්තු කර නොමැති බවත්, ව්‍යාපෘතිය සඳහා අදාළ ආයතනයන් වෙතින් ලබා ගත යුතු සක්‍යතා වාර්තා ද ලබා ගෙන නොමැත. මෙම ව්‍යාපෘතිය සඳහා දේශපාලන අධිකාරිය විසින් රු. 1,949,800.00 ක විමධ්‍යගත ප්‍රතිපාදන මුදල් එවා තිබුණද, ව්‍යාපෘතිය සාර්ථකව පවත්වාගෙන යාමට කටයුතු කර නොමැති බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>2011 වර්ෂයේ දී මා වෙත සභාවේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් සහ කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ අධීක්ෂණ කටයුතු භාර දෙන ලදී. එහිදී කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ වළවල් 03 ක් සකස් කර, කසළ දිරාපත් වීම සඳහා එම වළවල් 03 ට දමා තිබුණි. එය අසාර්ථක වැඩපිළිවෙලක් බව හඳුනා ගත් අප එම කාලයේ ජේ.සී.බී එක මගින් එම කසළ ගොඩට ගැනීමට කටයුතු කළ පසුව, එකී කසළ කිසිදු දිරාපත් වීමක් සිදු නොවී ඒ ආකාරයෙන්ම වළවල් තුළ තිබුණි. මේ සම්බන්ධයෙන් 2011 වර්ෂයේ දී වෛද්‍ය පිලපිටිය මහතා සමඟ සාකච්ඡා කර, එතුමා කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට ගෙන්වා ලබා ගත් උපදෙස් අනුව, කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. එසේම එම කාලයේම කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ පොල් පැළ 200 ක් සිටුවීමට කටයුතු කර තිබුණද, කොමසාරිස් පාලන කාලය තුළ එහි කිසිදු නඩත්තුවක් නොමැති වීම නිසා පොල් පැළ විනාශ වී තිබුණු. නැවතත් මා 2018 වර්ෂයේ දී පත් වී පැමිණි පසුව, ප්‍රමුඛතා කරුණක් සේ සලකා නැවතත් කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ පැළ සිටුවීමේ කටයුතු ආරම්භ කරන ලදී.</u>

2011 වර්ෂයේ අප තේරී පත්ව පැමිණි පසුව, කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ පැවැති අඩුපාඩු නිවැරදි කර ගනිමින් මේ වන විට ඉතාමත් සාර්ථකව පවත්වාගෙන යන අතර, එම ව්‍යාපෘතිය මේ වන විට ලාභ ලබන ව්‍යාපෘතියක් බවට පත් වී ඇත. දැනට එහි දිරන/නොදිරන ලෙස කසළ වෙන් වෙන් වශයෙන් තෝරනු ලබන බවත්, කසළ කිසිවක් මධ්‍යස්ථානයෙන් පිටත බැහැර කිරීමක් සිදු නොකරයි. සියලුම කසළ මධ්‍යස්ථානයේම තේරීම සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය ඉතාමත් සාර්ථකව පවත්වාගෙන යාම වෙනුවෙන් මධ්‍යස්ථාන භාරකරු සුනිල් විතාරණගේ මහතාට ස්තූතිය පුද කළ යුතුය.

මෙකී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීමේ දී, 2007.08.21 න් පසුව ලේඛන කිසිවක් නඩත්තු කර නොමැති බැවින්, ව්‍යාපෘතියට අදාළ ඉදිරි කටයුතු සිදු කර නොමැති නිසා එහි වගකීම අප පාලන කාලයට භාර ගත නොහැක. නමුත් මෙම ව්‍යාපෘතිය ඌන ව්‍යාපෘතියක් ලෙස සැලකිය නොහැකි බැවින්, ව්‍යාපෘතිය ආරම්භ කළ කාලයේ කිසිදු සැලැස්මක් නොමැතිව ආරම්භ කර ඇති ව්‍යාපෘතියක් සේ සලකා මෙහිදී කටයුතු කිරීමට සිදු වන දන්වා සිටින ලදී.

මෙම ව්‍යාපෘතිය ඌන ව්‍යාපෘතියක් සේ සැලකුවද, එය ඌන ව්‍යාපෘතියක් නොවේ. මේ සම්බන්ධයෙන් පවතින ලිපි ගොණුව යාවත්කාලීන කර නොමැති නිසා, තොරතුරු සොයා ගැනීමට නොහැක. දැනට පවතින ලිපි ගොණුවෙහි ව්‍යාපෘතිය සම්බන්ධ සැලසුම් හෝ බලපත්‍ර ලබා ගැනීමට වගකිව යුතු ආයතනයන් වෙත ලිපි යවා ඇති බවට කිසිදු සටහනක් හෝ ලිපියක් ගොණු කර නොමැත. එම නිසා මෙහි වගකීම එම පාලන කාලයේ සිටි ගරු සභාපතිතුමා ඇතුළු පාරිපාලන නිලධාරීන්ට භාර දිය යුතු බවත්, යම් දිනක මෙය අධිකරයට ලක් වුවහොත් එහි වගකීම කිසි දිනක අපට භාර ගත නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. ගල් කුෂර් ව්‍යාපෘතිය ඌන වත්කමක් සේ අප නොසලකන බවත්, මෙය වෙන්දේසි කිරීමට අප එකඟ නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. තිස්සමහාරාම වෙළඳ සංගමය, වෙළඳ ප්‍රජාව සහ තිස්සමහාරාම ප්‍රදේශීය සභාව එක්ව තිස්සමහාරාම නගරය ඇතුළු අවට ප්‍රදේශයන් තුළ සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීම සඳහා සේම ජන ජීවිතය ආර්ථික මට්ටමින් නඟා සිටුවීම සඳහාත්, ප්‍රාදේශීය සභාවේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම සඳහාත් සංවිධානය කරනු ලබන සංචාරක ප්‍රවර්ධන වැඩසටහන සිදු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

17. කිරින්ද පූජා නගර රථ වාහන නැවතුම්පොළ හා තිස්සමහාරාම පූජා නගර රථ වාහන නැවතුම්පොළ බදු සහන ලබා දෙන ලෙස බදුකරුවන් කරන ලද ඉල්ලීම් අනුව, ආදායම් පරීකෂක වාර්තා ද සමඟ, 2022 සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් මාස සඳහා බදු සහන ලබා දීම සුදුසු බවට 2022.12.20 දින පැවැති ගරු මහා සභාවට ඉදිරිපත් කළ අතර, එහිදී මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර, කමිටුව විසින් බදු සහන ලබා දීම පිළිබඳ තීරණයක් ලබා ගෙන, නැවත මහා සභාවට ඉදිරිපත් කිරීමට ලබා දුන් තීරණය අනුව, ඒ සඳහා පත් කර ගන්නා ලද කමිටුව මගින් ලබා ගත් පහත තීරණයන් අනුව, බදු සහන ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

1. කිරින්ද රථ වාහන නැවතුම්පොළ සඳහා රථ වාහන සැප්තැම්බර් , ඔක්තෝබර් හා නොවැම්බර් මාස සඳහා පැමිණීමේ අඩුවක් පැවැති බැවින්, 50% ක බදු සහනයක් ලබා දෙන ලෙස බදුකරු විසින් දන්වා සිටින ලදී. ඒ අනුව බදු සහන ලබා දීම සඳහා ආදායම් පරීක්ෂක වාර්තාව හා බදුකරුගේ එකඟතාවය අනුව, 50% ක බදු සහනයක් කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ සඳහා ලබා දීම සුදුසු බවට කමිටුව තීරණය කරන ලදී.

2. පත් කරන ලද කමිටු සාමාජිකයින් තිස්සමහාරාම රථ වාහන නැවතුම්පොළ සහ වැව් කණ්ඩියෙහි ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර, බදුකරුවන් සහ වෙළඳුන් සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. ඒ අනුව, තිස්සමහාරාම රථවාහන නැවතුම්පොළ සඳහා පැමිණෙන වාහන ප්‍රමාණය අඩු වී ඇති බවත්, තිස්සමහාරාම පන්සල පිටුපස ඇති භූමිය, තිස්සමහාරාම රජමහා විහාරය මගින් ගාස්තු අය කිරීමකින් තොරව වාහන නවතා තැබීම සඳහා ලබා දීම හේතුවෙන් මෙම පූජා නගර රථ වාහන නැවතුම්පොළ සඳහා පැමිණෙන වාහන ප්‍රමාණය අඩු වී ඇති බව කමිටුව විසින් නිරීක්ෂණය කර ප්‍රකාශ කරන ලදී.

තවද , තිස්සමහාරාම වැව් කණ්ඩියෙහිද රථවාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකර කරනු ලබන අතර , මෙම නැවතුම්පොළෙහිද පසුගිය මාස කිහිපය තුල රථවාහන පැමිණීමේ අඩුවක් පැවති බැව් වෙළඳුන් විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් මාස 03 සඳහා 75% ක බදු සහනයක් තිස්සමහාරාම පූජා නගර රථ වාහන නැවතුම්පොළ සඳහා ලබා දීම සුදුසු බවට කමිටුව විසින් තීරණය කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

18. දෙබරවැව ඉමෙඩ්රෝ ග්‍රාමසිය අසලින් පොළ භූමියට ප්‍රවේශ වන මාර්ගය සකස් කිරීම සඳහා පුහුණු/ නුපුහුණු ශ්‍රමිකයින් වෙත ගෙවීම් සිදු කිරීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද ගෙවීම් වාර්තාවට අනුව, රු. 37,800.00 ක මුදලක් ගෙවීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | දින ගණන | එක් දිනකට මුදල (රු) | මුළු මුදල (රු) |
|---|---|---|---|
| පුහුණු | 03 | 3,600.00 | 10,800.00 |
| පුහුණු | 10 | 2,700.00 | 27,000.00 |
| **එකතුව** | | | **37,800.00** |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

19. 1987 වර්ෂයේ දී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් නව කඩ කාමර ඉදි කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ දී ඩබ්.ඒ. ආරියරත්න සහ බී.ඒ. වීරසිංහ යන අයගේ ඉඩම් ලබා ගැනීම හේතුවෙන්, ඒ වෙනුවට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ඉඩමක ඔවුන්ගේ වියදමින් කඩ කාමර සාදා ගැනීම සඳහා එවකට අවස්ථාව ලබා දී ඇති අතර, 1987 වසරේ සිට මේ දක්වා වසර 35 ක පමණ කාලයක් මෙම දේපළ මොහුන් විසින් භුක්ති විඳින බවට අදාළ ග්‍රාම නිලධාරී වසම භාර ග්‍රාම නිලධාරී සහ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක විසින් ද සනාථ කර ඇති බැවින්, මෙම දේපළවල වර්තමාන හිමිකාරීත්වය ඩබ්.ඩී.එන්. ප්‍රනාන්දු සහ කේ.පී. අමරා යන අයගේ නමින් සංශෝධනය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

20. පහත සඳහන් ඇස්තමේන්තු සඳහා නිර්දේශය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කර්මාන්තයේ නම | මුදල |
|---|---|---|
| 01 | වීරහෙල ඇල මාවත මෝටර් ග්‍රේඩර් කිරීම | 273,451.50 |
| 02 | දුංකොළවත්ත මාවත මෝටර් ග්‍රේඩර් කිරීම | 91,150.50 |

| | | |
|---|---|---|
| 03 | ඇල්ලගල මෙත්සිත් මාවත මෝටර් ග්‍රේඩර් කිරීම | 369,731.00 |
| 04 | රත්නෙළුම්වල යාය බුබුල පාර මෝටර් ග්‍රේඩර් කිරීම | 992,516.25 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>සෘජු ශ්‍රමික පදනම මත මෙම කාර්යය සිදු කිරීමේ දී, ඒ සඳහා යෙදවීමට සභාව සතුව කම්කරුවන් අවම වීම හේතුවෙන්, පුහුණු/නුපුහුණු ශ්‍රමිකයින් පිටතින් ලබා ගෙන මෙම කර්මාන්ත සිදු කිරීම සුදුසු බව තීරණය කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

21. කාවන්තිස්සපුර පෙර පාසල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ගොඩනැගිල්ල වටා දැල් ගැසීම සහ යකඩ දොරවල් සකස් කිරීම සඳහා රු. 647,470.10 ක වටිනාකමින් යුත් ඇස්තමේන්තුවට අදාළව මෙම කර්මාන්තය සෘජු ශ්‍රමික පදනම මත සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>සෘජු ශ්‍රමික පදනම මත මෙම කාර්යය සිදු කිරීමේ දී, ඒ සඳහා යෙදවීමට සභාව සතුව කම්කරුවන් අවම වීම හේතුවෙන්, පුහුණු/නුපුහුණු ශ්‍රමිකයින් පිටතින් ලබා ගෙන මෙම කර්මාන්තය සිදු කිරීම සුදුසු බව තීරණය කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, චාලි ගුණරත්න මහතා</u>**

22. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යෝධ වැවේ අවධානම් තත්ත්වය පිළිබඳව 2022.12.20 දින පැවැති මාසික මහා සභාවේ දී දීර්ඝ ලෙස සාකච්ඡා වූ අතර, ඒ පිළිබඳව වාරිමාර්ග ඉංජිනේරුතුමා වෙත ප්‍රාදේශීය සභාව මගින් දන්වා යවා තිබුණද, එය සකස් කිරීම සඳහා ප්‍රතිපාදනවල ගැටළුවක් පවතින බැවින්, ඉහත සඳහන් කරුණු පිළිබඳව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්තුමා වෙත දන්වා හදිසි ආපදා යටතේ හෝ මෙම අවධානම අවම කිරීම සඳහා ප්‍රතිපාදන මුදලක් තිස්සමහාරාම වාරිමාර්ග කාර්යාලය වෙත ලබා දීමට කටයුතු කරන ලෙසට දන්වා යැවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>යෝධ වැව ආශ්‍රිත ජල කාන්දුව විශාල වුවහොත් එම ප්‍රදේශයට දැඩි හානියක් සිදු විය හැකි බැවින්, මෙය ආපදාවක් සේ සලකා හදිසි ආපදා තත්ත්වය යටතේ හෝ සකස් කර දෙන ලෙසට දිස්ත්‍රික් ලේකම්තුමා වෙත ලිපියක් මගින් දන්වා යැවීමට තීරණය විය.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, චාලි ගුණරත්න මහතා</u>**

මෙකී කරුණ සම්බන්ධයෙන් මා 2022.12.20 දිනැති මහා සභාවට ඉදිරිපත් කරන යෝජනාව අනුව, ඒ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලිපියක් මගින් දන්වා යැවීමට කටයුතු කිරීම පිළිබඳ ස්තුතිය පුද කරන අතර, ඉදිරියටත් තිබෙන අවධානම් තත්ත්වය පිළිබඳ සලකා බලා අවධානයෙන් යුතුව කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -

- 2023.01.04 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2023.01.04 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2023.01.04 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2023.01.04 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

## (ඌ) වෙනත් කරුණු

- **ගරු ප්‍රාදේශීය සභා සභික, වාලි ගුණරත්න මහතාගේ අදහස් දැක්වීම**

මා මහජන නියෝජිතයෙක් ලෙස බොහෝ කලක් ජනතාව වෙනුවෙන් පෙනී සිට කටයුතු කර ඇත. එසේ කටයුතු කරන ලද පාලන කාලයන්ට වඩා මෙම කාලය තුළ සෑම කටයුත්තක්ම ඉතාමත්ම නිවැරදිව සිදු කරන බව කිව හැකිය. එසේම පසුගිය පාලන කාලයන් තුළ ලේකම් ලෙස කටයුතු කළ ලේකම්වරුන්ට වඩා මෙම කාලයේ සේවය කරන ලේකම්තුමිය සිදු කරන්නාවූ සෑම කටයුත්තක්ම ඉතාමත් නිවැරදිව සිදු කරනු ලබයි. මා ඇතුළු ගරු සභිකයන්ගේ ඉල්ලීම් ඉටු කර දීමට ඇප කැප වී කටයුතු කරන ලේකම්තුමියක් ලෙස සඳහන් කළ යුතුය. මා නියෝජනය කළ කාලයන් වලට වඩා සභා වාර්තාව අප හට පැහැදිලිව කියවා ගත හැකි වන පරිදි විධිමත්ව නිවැරදිව සකස් කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් සහ එතුමිය සිදු කරන්නා වූ නිවැරදි වැඩපිළිවෙලට ගෞරවණීය ස්තුතිය පුද කරන ලදී.

එලෙසට මා ගරු සභාපතිවරුන් කිහිප දෙනෙක් සමඟ කටයුතු කරන ලදී. නමුත් අපගේ ගරු සභාපතිතුමා එම සභාපතිවරුන්ට වඩා ජනතාව වෙනුවෙන් වැඩි සේවාවන් රැසක් සිදු කළ නිවැරදි, හොඳ නායකයෙක් ලෙස දැන්විය යුතුය. රටේ වසර කිහිපයක් තුළ ඇති වූ නොයෙක් බාධකයන් හමුවේ වුවත්, ජනතාව වෙනුවෙන් හැකි පමණින් ජනතාවාදී සේවය ඉටු කිරීමට ඇප කැප වී කටයුතු කරන ලදී. එලෙසට ගරු සභාපතිතුමා විසින් සිදු කරන්නා වූ සේවයට එතුමන්ට ගෞරවණීය ස්තුතිය පුද කර සිටින ලදී.

අප මහා සභාවට සහභාගී වන මාධ්‍යවේදීන් ද අප ප්‍රකාශ කරන පුවත් කිසිදු අඩුපාඩුවකින් තොර නිවැරදිව වාර්තා ගත කිරීම වෙනුවෙන් එතුමන්ලාටත් ස්තුතිය පුද කර සිටින ලදී.

පසුගිය වර්ෂයන්ට වඩා 2023 වර්ෂයේ අයවැය මගින් ආදායම රුපියල් කෝටි 21 ක් දක්වා වැඩි කර ගැනීමට කටයුතු කර ඇත. මෙලෙස ආදායම් ඉලක්ක සපුරා ගැනීමට හැකි වුවහොත් තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් වැඩි සේවාවන් රැසක් ඉටු කර දීමට හැකි වනු ඇත. එසේම මෙලෙස ආදායම් ඉලක්ක වැඩි කර ගැනීමට ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින්, ලේක්ම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දුන් සහාය නිසාවෙන්, එම සියලුම දෙනාට ස්තුතිය පුද කළ යුතුය.

ගරු සභිකයින් සියලුම දෙනා අද වන තෙක් ඔවුන්ගේ ගෞරවය රැකෙන පරිදි කටයුතු කිරීම පිළිබඳවත්, ගරු සභිකයින් තම සභික ධූරය ආභරණයක් කර නොගෙන ජනතාව වෙනුවෙන්ම ඇප කැප වී සේවය කිරීම වෙනුවෙන් එතුමන්ලා සියලුම දෙනාටත් ස්තුතිය පුද කරන ලදී.

මා හා ගරු උප සභාපතිතුමා දීර්ඝ කාලයක් ප්‍රාදේශීය සභාව නියෝජන කර ඇති ජ්‍යෙෂ්ඨ සභිකයින් දෙපලකි. මා කාලයක් දේශපාලනය කර, ඉන් අනතුරුව මාගේ කොට්ඨාසය නියෝජන කරමින් කටයුතු කිරීම සඳහා ගරු සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාට අවස්ථාව ලබා දුන් අතර, එතුමන් එම කොට්ඨාසයේ වැඩ කටයුතු සොයා බලා නිසි පරිදි ඉටු කිරීමට කටයුතු කිරීම සතුටට කරුණක් වන බවත්, එතුමන්ට ඒ වෙනුවෙන් ස්තුතිය පුද කර සිටින ලදී.

ගරු උප සභාපතිතුමා නැවත මැතිවරණය සඳහා ඉදිරිපත් නොවීම කණගාටුවට කරුණකි. ජනතාව වෙනුවෙන් ඇප කැප වී තවත් ඉදිරියට සේවයක් කිරීමට හැකි මහජන නියෝජිතයින් ඉදිරියටත් ජනතාව වෙනුවෙන් කටයුතු කිරීමට හැකි නම් ඒ පිලිබඳ මා සතුටු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

මේ දක්වා පෙනී සිටි සභා වාරයන් තුළ ඇතැම් යෝජනා සඳහා වාද විවාද කරමින් කටයුතු කළද, ඒ සියල්ලක්ම සිදු කරන ලද්දේ ජනතාව වෙනුවෙන් පෙනී සිට කතා කිරීම සඳහාය. ගරු සභික ආර්. රජිත ප්‍රියදර්ශන මහතා, ඒ.පී. ධම්මික මහතා සමඟ මහා සභාව තුළ ඇතැම් වාද විවාද සිදු කර ඇති අවස්ථාවන් ද තිබෙනු ඇත. එලෙස කටයුතු කරන ලද්දේ ද ජනතාව වෙනුවෙන් බව කිව යුතුය. කෙසේ වෙතත් මේ දක්වා ආ ගමන තුළ මාගෙන් යම් වැරැද්දක් සිදු වුයේ නම්, ඒ සඳහා මා සමාව අයදිමි.

යෝධ වැව වළ දොර අසල තිබෙන ජල කාන්දුව, ඒ අසල තිබෙන මාර ගස්වල මුල් විහිදී ගියහොත් වැඩි වීමක් සිදු විය හැකිය. එලෙස ජල කාන්දුව වැඩි වුවහොත් එම ප්‍රදේශයට දැඩි විනාශයක් සිදු විය හැකිය. මේ සම්බන්ධව පවතින අවධානම කිහිප වරක් වාචිකව සහ ලිඛිතව දැන්වීමට කටයුතු කරන ලදී. මාගේ එම ඉල්ලීම පිලිබඳ සලකා බලා අදාළ ආයතනයන් වෙත මේ සම්බන්ධයෙන් දන්වා යැවීමට කටයුතු කිරීම පිළිබඳ ස්තුතිය පුද කර සිටින අතර, ඉදිරියටත් මෙමගින් අවධානම් තත්ත්වයක් ඇති විය හැකි බැවින්, මෙය ආපදා තත්ත්වයක් වන බැවින්, දිස්ත්‍රික් ලේකම්තුමා වෙත දන්වා ආපදා යටතේ හෝ මෙය සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටීම සුදුසු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

අප නායක හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ අප නායක ගරු චමල් රාජපක්ෂ මැතිතුමා සමඟ සාකච්ඡා එතුමන්ලාගේ උපදෙස් පරිදි, උද්ධකන්දර ප්‍රදේශයේ ඉදි කරන ලද ගම්මානයේ එක් ඉඩම් කැබැල්ලක් ගරු සභික, ඒ.පී. ධම්මික මහතාට ලබා දීමට කටයුතු කරන ලදී. එලෙසට පාට පක්ෂ භේද නොබලා එම කටයුත්ත තමා සිදු කළ බව ප්‍රකාශ කරන ලදී. මා දේශපාලනය සිදු කිරීමේ දී කිසි දිනක වෛරී සහගත ලෙස කටයුතු කර නොමැත. ගම වෙනුවෙන් ජනතාව වෙනුවෙන් සිදු කළ හැකි සේවය උපරිම අයුරින් ඉටු කර ඇති බව කිව යුතුය. කිරින්ද, සුදුවැලිපැලැස්ස, කාක බෝධිය ආදී ප්‍රදේශ සඳහා පානීය ජලය නොමැති වූ අවස්ථාවේදී ජලය ලබා දීම සඳහා මැදිහත් වී කටයුතු කරන ලදී. අට්ටික්කාව අමුණ සකස් කිරීම සඳහා ද මා දැඩි මැදිහත්වීමක් ලබා දී කටයුතු කර ඇත. ජනතාව වෙනුවෙන් ඉටු කළ සෑම සේවාවක්ම සිදු කිරීමට හැකි වුයේ අප නායක හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ අප නායක ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත්වීම සහ ශක්තිය නිසා බව සඳහන් කරන ලදී.

අප සභාවේ හිටපු උප සභාපතිවරයෙක් වන ප්‍රේමදාස මහතා ඇතුළු මා දම්වැලක් සේ එකට එකතු වී අට්ටික්කාව අමුණ සකස් කිරීමට කටයුතු කරන ලදී. ඒ සඳහා අප දෙදෙනා දැඩි දාඩිය මහන්සිය හෙලා ඉතාමත් කැපවීමෙන් යුතුව කටයුතු කරන ලදී. මෙම කාර්යයේදී ගෞරවයක් ලබා දිය යුතුය දැනට කථානායක ධූරය හොඹවන මහින්ද යාපා අබේගුණවර්ධන මැතිතුමාට එතුමා මේ

සඳහා විශාල ප්‍රතිපාදන මුදලක් ලබා දෙන ලදී. එසේම නීතිඥ ගුණසෝම වික්‍රමසිංහ මැතිතුමාටත් මේ සඳහා ස්තුතිය පුද කළ යුතුය. අට්ටික්කාව අමුණ සකස් කිරීමේදී දැඩි මැදිහත්වීමක් දක්වන ලද අප නායක ගරු විමල් රාජපක්ෂ මැතිතුමා පැමිණ එහි නිරීක්ෂණයක් ද සිදු කරන ලදී. අප නායකතුමන්ලා අප පක්ෂයේ මැති ඇමතිවරුන් සමඟ සාකච්ඡා කර අප ප්‍රදේශය සඳහා විශාල සේවාවන් රැසක් සිදු කර ඇත. මා ඉදිරියේ නැවත මැතිවරණයක් සඳහා ඉදිරිපත් නොවනු ඇත. මා මෙතෙක් ආ දේශපාලන ගමනේ මා හට සිදු කර ගැනීමට නොහැකි වූයේ අප ප්‍රදේශවල පවතින රැකියා අර්බුධය සඳහා විසඳුම් ලබා දීමට නොහැකි වීමයි.

ප්‍රදේශයේ ජනතාවට පවතින රැකියා ගැටළුව සඳහා මා නිරන්තරයෙන්ම කතා කරන ලදී. ප්‍රදේශයේ රැකියා අවස්ථාවන් ඇති කිරීම සඳහා ප්‍රදේශයේම තිබෙන සම්පතක් ලෙස කෝමාරිකා ලබා ගෙන, කෝමාරිකා නිෂ්පාදන ආයතනයක් ආරම්භ කිරීම සුදුසු වන බවත්, එමගින් ප්‍රදේශයට රැකියා අවස්ථාවන් බොහොමයක් ලබා ගත හැකි බවත්, එමගින් අප රටට විදේශ විනිමය ගෙන්වා ගැනීමට ද හැකි වේ. මෙම ආයතනය ඉදි කිරීම සම්බන්ධයෙන් මූලික කටයුතු සිදු කර, අදාළ සහයෝගයන් අප හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් සහ ගරු විමල් රාජපක්ෂ මැතිතුමාගෙන් ලබා ගැනීමට කටයුතු කළ හැකි නම් එකී කාර්යය සාර්ථකව සිදු කළ හැකි බව ප්‍රකාශ කරන ලදී.

අප ප්‍රදේශය තුළ සියඹලාගස්වැව, රුවන් වැව ආදිය වැව් 14 ක් සකස් කර ඇත. එම ප්‍රදේශයේ ඉතාමත් අඩු ආදායම්ලාභී අහිංසක මිනිසුන් ජීවත් වේ. මාගේ සහ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මත එම ප්‍රදේශයට වැව් රැසක් සකස් කර ගැනීමට හැකි විය. එම ප්‍රදේශයේ පවතින කිසිදු බිම් අඟලක්, අලුතින් සකස් කරන ලද කුඹුරු ඉඩමක් මාගේ කිසිදු ඥාතියෙකුට ලබා දී නොමැති නිසා ඒ සම්බන්ධයෙන් මට ආඩම්බර විය හැකිය. ව්‍යාපාරිකයින් විසින් මෙම වැව් කාවේ සහ වැව් ධාරා ප්‍රදේශවල බැද ඇති කුඩා වැව්වලින් ඇහිරී ඇති බැවින්, මෙම වැව් ආරක්ෂා කර දෙන ලෙසටත්, මෙහි බැද ඇති කුඩා වැව් පිළිබඳ සොයා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසටත් ඉල්ලා සිටින ලදී.

ඉදිරියේ මැතිවරණයක් පැමිණියහොත් ගරු සභිකයින් සියලුම දෙනා ඒ සඳහා පෙනී සිට ජයග්‍රහණය කර නැවතත් සභාව නියෝජන කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී. අප කණ්ඩායමේ සභිකයින් සඳහා තම සහාය ලබා දෙන අතර, අනෙක් පක්ෂවල සභිකයින් වෙත තම ආශිර්වාදය ලබා දෙන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

ලැබුවා වූ 2023 නව වසර සියලුම දෙනාට නිදුක් නීරෝගී සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>**

ගරු සභික, වාලි ගුණරත්න මහතා සභික ධුරය දරණ කාලය තුළ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් වැව් රැසක් සකස් කරමින්, ඒ තුළින් කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක් අලුතින් සැකසීම සිදු කරනු ලැබුවත්, ඒ තුළින් කිසිදු ප්‍රතිලාභයක් තම ඥාතිවරයෙකුටවත් ලබා නොදී, ජනතාව වෙනුවෙන්ම සේවය සිදු කළ බව මා හොඳින් දන්නා කරුණක් බව සඳහන් කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මියගේ අදහස් දැක්වීම</u>**

ගරු උප සභාපතිතුමා සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා කොට්ඨාසයන්වල සංවර්ධන යෝජනා නම් කිරීමට ගෙන එනු ලබන යෝජනා 02 සම්බන්ධයෙන් සතුටු වන බවත්, මෙවැනි දේ කාලයකට නොව දීර්ඝ කාලීනව සිදු කරන්නේ නම් ඉතාමත් වටින බව ප්‍රකාශ කරන ලදී. දෙබරවැව ජාතික පාසලේ ගොඩනැගිලි සකස් කර ඉදි කරන ලද්දේ මාගේ සීයා කෙනෙක් වුවත්, ඒ සඳහා තුති පිදුමක් ලෙස හෝ එතුමන්ගේ නමක් එහි සඳහන් කිරීමක් සිදු කර නොමැත. තවද ආරණ්‍ය සේනාසනයක්ද තම සීයා සකස් කර තිබුණද, දැනට එහි තම සීයාගේ ඡායා රූපයක් හෝ සිදු කරන තැනැත්තාගේ කිසිදු විස්තරයක් සඳහන් කර නොමැත. සිදු කරන්නා වූ සංවර්ධන කටයුතුවලදී, එය සිදු කිරීමට දායකත්වය දරණ පුද්ගලයාට තුති පිදුමක් ලෙස එය නම් කිරීමට හැකි නම් එය හොඳ දෙයකි.

අට්ටික්කාව අමුණ ගරු විමල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත්වීම මත සකස් කිරීම නිසා, ගොවි ජනතාවට මේ වන විට යල/මහ කුඹුරු කිසිදු ගැටළුවකින් තොරව සිදු කිරීමට හැකි වී ඇත. මෙම

ව්‍යාපෘතිය සිරිමාවෝ ජනාධිපති කාලයේ සිදු කරන ලද්දකි. අට්ටික්කාව අමුණ සකස් කිරීමේ දී ඒ සඳහා අපද සහාය ලබා දී ඇත. මෙය සකස් කිරීමේ දී යම් පුද්ගලයින් මෝඩ ඇලක් ලෙස නාමයක් දුන්නද, ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත්වීම මත මෙම අමුණ සාර්ථකව සකස් කර ඇති බව සතුටින් දැන්විය යුතුය.

දේශපාලන දිවියේ හොඳ නායකයෙක් ලෙස ගරු සභාපතිතුමා නිවැරදිව කටයුතු කිරීම පිළිබඳ අගය කළ යුතුය. පෙර පාලන කාලයන් හි ආරම්භ කර අඩුපාඩු වී තිබූ ආදාහනාගාරය, කොම්පෝස්ට් මධ්‍යස්ථානය ආදිය අඩුපාඩු සකසා ගනිමින් මෙම පාලන කාලය තුළ ඉතාමත් සාර්ථකව පවත්වාගෙන යාම සතුටට කරුණකි. එසේම අද දින සාකච්ඡා වූ ගල් ක්‍රෂර් මධ්‍යස්ථානය ද එම කාලය තුළ අඩුපාඩු සහිතව හෝ ආරම්භ කර තිබුණේ නම්, එයද අද වන විට ගරු සභාපතිතුමා සාර්ථකව පවත්වාගෙන යාමට කටයුතු කරන බව විශ්වාසයෙන් යුතුව කිව හැකිය.

අද දින ආයතනයේ අංශ වශයෙන් රාජ්‍ය නිලධාරීන් ඇගයීමට ලක් කරන ලදී. එම නිලධාරීන් අතරින් බොහොමයක්ම කාන්තා නිලධාරීන්ය. ආයතනයේ ප්‍රධානිය වන ලේකම්තුමියද කාන්තා නිලධාරිනියක් ලෙස එතුමියගේ උගත් බුද්ධියත්, ලබා ගෙන ඇති දැනුමත් සමඟ එතුමියට ලැබිය යුතු නිසි තැන ලැබී ඇති බව සඳහන් කළ යුතුය.

අප පාලන කාලය තුළ මේ දක්වා ප්‍රාදේශීය සභාවක් ලෙස සිදු කරන්නා වූ සියලුම කටයුතු සඳහා ගරු සභාපතිතුමාට ලබා දුන් සහාය වෙනුවෙන් ගරු උප සභාපතිතුමාටත්, ගරු සභිකයින්ටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කරන ලදී.

ඉදිරියේ මැතිවරණයක් පැවැත්වුවහොත්, ගරු සභාපතිතුමා සමඟ මා හටද ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා සභික, ජී.එච්.ජී. නීටා මහත්මියගේ අදහස් දැක්වීම**

මා සභාව සඳහා සභිකවරියක් සේ තේරීපත්ව පැමිණි දින සිට අද වන තෙක් කිසිදු ගැටළුවක් ඇති කර නොගෙන, ගරු සභාපතිතුමා සමඟ සුහදශීලීව කටයුතු කර ඇති බව දැන්විය යුතුය.

පෙර පාසල් ක්ෂේත්‍රයේ සිටි කෙනෙක් ලෙස මා හොඳින් දන්නා කරුණක් ලෙස පුබුදු පෙර පාසලේ ගුරුවරිය වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ මාසික දීමනාව පරිත්‍යාග කර උතුම් ක්‍රියාවක් සිදු කරන බව සිහිපත් කළ යුතුය. එසේම ගරු සභාපතිතුමාගේ මාසික දීමනාව පෙර පාසල් ගුරුතුමිය වන ශ්‍යාමලී මහත්මිය සඳහා ලබා දීම වෙනුවෙන් එතුමිය ගරු සභාපතිතුමාට පුණ්‍යානුමෝදනා කළ බව ද දන්වා සිටින ලදී.

එසේම මා ද ලබා ගන්නා සභික දීමනාවෙන් හැකි පමණින් ජනතා සේවය ඉටු කිරීමට කටයුතු කරනු ඇත. පන්නෙගමුව කොට්ඨාසයේ අඩු ආදායම්ලාභී පවුලක පාසල් දරුවකු සඳහා පාසල් උපකරණ ලබා දීමට කටයුතු කරන ලදී. තවද, මල ගෙදරක් වූ පසුව හැකි පමණින් මා රු. 5,000.00 ක දීමනාවක් එම පවුලට ලබා දීමට කටයුතු කරන අතර, එම පවුලේ අවශ්‍යතාවයන් පිළිබඳ ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කර ඉටු කර දීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී. අප ප්‍රදේශයේ නායක ස්වාමීන් වහන්සේලා සමඟ 2023.02.04 වන දින අඩු ආදායම්ලාභී පවුල් සඳහා පොත් බෙදා දීමක් සිදු කිරීමට කටයුතු කර ඇති බැවින්, දායකත්වය ලබා දීමට කැමති අය ඒ සඳහා සම්බන්ධ වන ලෙසට ඉල්ලා සිටින ලදී.

ජනතා සේවයක් ඉටු කිරීම සඳහා මා වෙත ලැබුණු අවස්ථාවෙන් මා උපරිමයෙන් ජනතා සේවය ඉටු කර ඇත. මංමාවත්, බෝක්කු, ක්‍රීඩාපිටි, සුසාන භූමි, විථි පහන් නඩත්තු කටයුතු ආදිය සිදු කිරීමේ දී හැකි පමණින් මාගේ සහාය ලබා දී ඇති බව ප්‍රකාශ කරන ලදී.

එසේම සභිකයෙක් ලෙස මාගෙන් ඉටු විය යුතු සෑම සේවයක්ම සභාව වෙනුවෙන් ද මා ඉටු කර ඇත. මාසිකව පවත්වන මාසික මහා සභාව, ස්ථාවර කමිටු සහ විශේෂ සාකච්ඡා සඳහා සහභාගී වී ජනතාව වෙනුවෙන් ගනු ලබන තීන්දු තීරණවලට සහාය දී කටයුතු කර ඇත.

ජනතාව වෙනුවෙන් මා හැකි සෑම අවස්ථාවකම සේවය කර ඇත. නැවත මැතිවරණයක් පැමිණියහොත් නැවතත් සභිකයෙක් ලෙස තේරී පත් කිරීම ජනතාවගේ තීරණයයි. නැවත පැමිණීමට

හැකි වුවහොත් ලබා ගත් පන්නරය සමඟ ජනතාවට වැඩි සේවාවන් රැසක් ඉටු කිරීමට බලාපොරොත්තු වන බව දන්වා සිටින ලදී.

ගොවි සෙවණ ක්‍රීඩාංගනය ඉතාමත් අලංකාරවත් ලෙස සකස් කර ඇත. එහි අඩුපාඩුවක්ව පවතින වැසිකිලිය ද සකස් කර දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

මාධ්‍යවේදී ප්‍රේමසිරි මහතා නිවැරදි පුවත් වාර්තා ගත කිරීම වෙනුවෙන් එතුමන්ටත් ස්තුතිය පුද කරන ලදී. මා සහ ගරු සභික, චතුමිණි මෙනවිය දේශපාලන දිවිය ආරම්භයේ අපගේ ඉදිරි වැඩසටහන් කුමක්ද යන්න සිදු කරන ලද සංවාදයේ පුවත් වාර්තාවක් රුක්මන් රත්නායක මහතා පළ කර තිබූ බවත්, අද එතුමන් ද මේ අවස්ථාවේ සිහිපත් කරන ලදී.

පෙර පාසල් ක්ෂේත්‍රයේ සිට දේශපාලන දිවියට පැමිණීමේ දී ඒ සම්බන්ධ අවවාද, උපදෙස්, අනුශාසනා ලබා දෙමින් විපක්ෂ නායකතුමා මා හට ලබා දුන් ගුරුහරුකම් වෙනුවෙන් එතුමන්ට ස්තුතිය පුද කරන ලදී. එසේම මා අසලම මාගේ සහෝදරයෙක් සේ හිද සහාය ලබා දෙන ගරු සභික, වන්නිගේ මහතාටත්, මා හට මවක් සේ සිටින ගරු සභික, නන්දා මහත්මියටත්, මා හට පෞද්ගලික අතින් බොහෝ සහයෝගයක් ලබා දුන් ගරු සභික, ඒ.පී. ධම්මික මහතාටත්, අනෙකුත් සියලුම ගරු සභිකයින්ටත් මා වෙත ලබා දුන් සහායට ස්තුතිය පුද කරන අතර, ඔවුන්ගේ ඉදිරි කටයුතු සාර්ථකව සිදු කර ගෙන යාමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින් වෙත නිදුක් නීරෝගී සුවය ප්‍රාර්ථනා කරන අතර, ඉදිරි මැතිවරණයෙන් සියලුම දෙනාට ජය ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

- <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම</u>

ලැබුවා වූ 2023 නව වසර රටවාසි, ප්‍රදේශවාසී සියලුම දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

අප පාලන කාලය තුළ තවත් ඉදිරියට අපට සිටිය හැකිද නොහැකිද යන්න තවමත් කිව නොහැක. මා නැවතත් මැතිවරණයක් සඳහා ඉදිරිපත් නොවනු ඇත. මා දේශපාලන දිවියට පැමිණීමත් සමඟ පක්ෂයක් ලෙස තම කොට්ඨාසය තුළ සිදු කරන්නා වූ සංවර්ධන කටයුතු සඳහා ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා, ගරු ඩී.වී. චානක මැතිතුමා සහ ගරු සභාපතිතුමා දැඩි මැදිහත්වීමක් ලබා දුන් අතර, ඒ වෙනුවෙන් එතුමන්ලා සියලුම දෙනාට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරන ලදී.

ගරු සභාපතිතුමා කර්මාන්ත කමිටුවේ සභාපති ධූරය සඳහා පත් කිරීමෙන් මා එම කටයුතු පිළිබඳ හොඳ පන්නරයක් ලබා ගනිමින් එකී කටයුතු සාර්ථකව සිදු කිරීමට හැකි විය. මා විවිධ ක්ෂේත්‍රයන්වල කටයුතු කරන ලදී, ඒ අතර බැංකු, වරායේ රාජකාරී, සමාජ සේවා ආදී කටයුතුවලද වැඩ කර විවිධ අත්දැකීම් ලබා ගන්නා ලදී. මා මේ දක්වා ආ ගමන තුළ මා සිදු කරන ලද කටයුතු වලදී ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු සභකයින්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දුන් සහාය ස්තුතිය පුද කරන ලදී.

මා දේශපාලනයට පිවිසියේ මාගේ පියා දේශපාලනයේ නිරත වී සිටි නිසාය. ආර්.ඒ. මුණිදාස වන මාගේ පියා වෘත්තීය සමිතිවල කටයුතු කරමින් සිටියදී, 1988-89 වර්ෂවල වෙඩි තැබීම් වලටද ලක්ව, දේශපාලන නිසා අවසානයේ මිය යාමට සිදු විය. පියාගෙන් ලැබුණු දේශපාලන දිවියේ පන්නරයත් සමඟ මා අද දක්වා ජනතාව වෙනුවෙන් දේශපාලනයේ යෙදී සිට කටයුතු කරන බව දැන්විය යුතුය.

මා ඉදිරියේ මැතිවරණය සඳහා පෙනී නොසිටියත්, ජනතාව වෙනුවෙන් මාගෙන් යම් උදව්වක් අවශ්‍ය වන ඕනෑම අවස්ථාවක මාගේ සහාය සෑම දිනකම ලබා දෙන බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතාගේ අදහස් දැක්වීම</u>**

අප සියලුම දෙනා දේශපාලන පක්ෂ වශයෙන් කටයුතු කළද, ගරු සභාපතිතුමාගේ නිවැරදි වැඩපිළිවෙල සඳහා සහාය ලබා දී ඇති බවත්, එතුමන්ගේ එම වැඩපිළිවෙල නිසාම ගරු සභිකයින් සියලුම දෙනා ගරු සභාපතිතුමාට නම්‍යශීලීව කටයුතු කරන බවත් සඳහන් කරන ලදී.

ඉදිරියේ දී මැතිවරණයක් පැවැත්වුවහොත් පක්ෂ විපක්ෂ සියලුම දෙනා කිසිදු ගැටුම්කාරී තත්ත්වයක් ඇති කර නොගෙන සාමකාමීව මැතිවරණ කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමා නිවැරදි නායකයෙක් ලෙස සභාවේ සිදු කරන්නා වූ සියලුම වැඩසටහන් විනිවිදභාවයෙන් යුතුව සිදු කර ඇති බවත්, කිසි දිනක කිසිදු වංචාවක් සිදු කර නොමැති බවත්, එතුමන්ගේ එම නිවැරදි වැඩපිළිවෙල අගය කරන බවත් ප්‍රකාශ කරන ලදී.

අප පාලන කාලය තුළ සම්මත කරන ලද සෑම අයවැයක් සඳහාම සහාය ලබා දී ඇත. යම් යම් පුද්ගලයින්, දේශපාලන නායකයින් ඒ සඳහා දෝෂාරෝපණ අප වෙත එල්ල කළත්, තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් සකස් කළ අයවැය නිසා අප ඒ සඳහා සහාය ලබා දුන් බව ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමාට අප සහාය ලබා දී කටයුතු කරන්නේ එතුමන්ගේ පක්ෂයේ නායකයින් නිසා නොව, ගරු සභාපතිතුමාගේ නිවැරදි වැඩපිළිවෙල නිසාය. එතුමන්ගේ එම වැඩපිළිවෙල අප සෑම දිනකම අගය කරන බව දන්වා සිටින ලදී.

ගරු සභාපතිතුමාගේ ඉදිරි කටයුතු සාර්ථකව සිදු කර ගෙන යාමට ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතර, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින් සියලුම දෙනාගේ ඉදිරි කටයුතු ද සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ලැබුවා වූ 2023 නව වසර සියලුම දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. සිසිර කුමාර මහතාගේ අදහස් දැක්වීම</u>**

2018 වර්ෂයේ මාගම කොට්ඨාසයේ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා සමඟ අභියෝගාත්මකව මැතිවරණය සඳහා කටයුතු කර කිරීමට සිදු විය. මැතිවරණයෙන් මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නවක සභිකයෙක් ලෙස සභාවට තේරී පත්වන ලදී. සභාවට තේරී පත් වූ දින සිට හැකි පමණින් ගරු සභාපතිතුමාගේ ද සහාය ලබා ගනිමින් ජනතා සේවය ඉටු කරන ලදී. තම කොට්ඨාසයේ දැනට සිටින ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ නැසීගිය පියාණන් වන ප්‍රේමදාස මහතා වෙනුවෙන් මාර්ගයක් නම් කිරීමට ගෙන ආ යෝජනා හොඳ දෙයකි.

පක්ෂ විපක්ෂ සියලුම ගරු සභිකයින්ට එකට එකතු වී ගමනක් යාමට හැකි වූයේ ගරු සභාපතිතුමා සියලුම දෙනාට හොඳ නායකයෙකු වූ නිසාවෙන්ය. පක්ෂ විපක්ෂ සියලුම ගරු සභිකයින්ටත්, තිස්සමහාරාමයේ ජනතාවටත් හොඳ නායකත්වයක් ලබා දීමට ගරු සභාපතිතුමා නැවතත් ඉදිරි මැතිවරණයෙන් තේරී පත් වීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

නවක සභිකයෙක් ලෙස අප සභාවට තේරී පත් වීමත් සමඟ, අප නොදන්නා බොහෝ දේ අපට කියා දෙමින් අවවාද, උපදෙස් ලබා දුන් ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමාට ස්තුතිය පුද කර සිටින ලදී.

විපක්ෂ නායකතුමා සෑම දිනකම ජ්‍යෙෂ්ඨ අදහස් දක්වමින් මහා සභාව තුළ දක්වන ලද අදහස්වලින් යම් යම් කරුණු ඉගෙන ගැනීමට හැකි වූ බවත්, ඒ වෙනුවෙන් එතුමන්ට ස්තුතිය පුද කළ යුතු බවත් ප්‍රකාශ කර සිටින ලදී.

එසේම පක්ෂ විපක්ෂ සියලුම සභිකයින් අද දක්වාම කිසිදු ගැටුමක් ඇති කර නොගෙන සහෝදරයින් සේ හිඳ ලබා දිය යුතු සෑම සහායක්ම ලබා දෙමින් දැක්වූ සහයෝගයටත්, ගරු සභික, එන්.ජී. සරත් මහතා අප ප්‍රදේශයෙන්ම පෙනී සිට සිදු කරන්නා වූ සෑම කටයුත්තකදීම ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී.

අප විසින් ඉල්ලීම් කරන ලද ඉල්ලීම් ඉටු කර දීමට කටයුතු කළ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට ස්තුතිය පුද කරන ලදී.

අපගේ පුවත් නිවැරදි ආකාරයෙන් වාර්තා ගත කරනු ලබන මාධ්‍යවේදීන්ටත් මාගේ ස්තුතිය පුද කර සිටින ලදී.

2018 වර්ෂයේ අප පත් වූ කාලයේ සිට 2022 වර්ෂය දක්වාම නොයෙකුත් බාධාකාරී තත්ත්වයන් රට තුළ ඇති වීමත් සමඟ සභාවේ ආදායම් තත්ත්වයද පහල බැසීමක් සිදු වුවත්, හැකි පමණින් සභාවෙන් ඉටු විය යුතු සේවාවන් ඉටු කිරීමට හැකි වූ බවත්, 2023 වර්ෂයේ ඉලක්ක ගත ආදායම රුපියල් කෝටි 22 ක් දක්වා වැඩි කර ගැනීමට දක්වන ලද උත්සාය හොඳ දෙයක් වන බවත්, එය මල්ඵල ගන්වා ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ අදහස් දැක්වීම</u>

වසර 05 කට ආසන්න කාලයක් අප සියලුම දෙනා සහෝදරයින් සේ එකට කටයුතු කරන ලදී. දේශපාලනය දිවිය තුළ පක්ෂ විපක්ෂව මතවාදිව කටයුතු කළත්, අප ප්‍රදේශයන් තුළ අප සියලුම දෙනා සාමුහිකව කටයුතු කරනු ඇත. 2018 වර්ෂයේ නවක සභිකයෙක් ලෙස සභාවට තේරී පත් වී කටයුතු කිරීමත් සමඟ බොහෝ දැනුම් සම්භාරයත් ලබා ගැනීමට හැකි වූ බවත්, එම දැනුම ලබා ගනිමින් නිවැරදි වැඩපිළිවෙලක් ගෙන යාමට හැකි වූ බවත් ප්‍රකාශ කර සිටින ලදී.

ගරු සභාපතිතුමාගේ හොඳ නායකත්වය අපට සෑම දිනකම ලබා දුන් නිසා, අපගේ වැඩපිළිවෙල නිවැරදිව කර ගැනීමට හැකි වූ බවත්, සෑම සභායක්ම ඒ වෙනුවෙන් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. එසේම ගරු සභාපතිතුමා මැතිවරණයෙන් නැවත තේරී පත්ව, තිස්සමහාරාමයේ ජනතාවට නැවතත් සභාපති වී වැඩි සේවාවන් රැස්ක් ඉටු කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2018 වර්ෂයේ අප තේරී පත් වූ පසුව, තිස්සමහාරාමයේ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර හිඟ මාසික කුලිය එකතු වී රු. 9,700,000.00 ක මුදලක් දක්වා වැඩි වීමත් සමඟ තිස්සමහාරාමයේ දැඩි අපහසුතාවයටත්, මානසික පීඩනයටත් පත්ව සිටි කඩ කාමර හිමියන් සඳහා සහනයක් ලබා දීම පිණිස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගනිමින් එම මුදල කපා හැරීමට කටයුතු කරන ලදී. එයද අප කාලයේ ජනතාව වෙනුවෙන් සිදු කළ සේවාවකි.

ගරු සභාපතිතුමා විශිෂ්ඨ පුද්ගලයෙකි. තිස්සමහාරාමයේ පළමු පුරවැසියා ලෙස ගෞරව නාමයෙන්ද හඳුන්වනු ලබයි. තිස්සමහාරාමයට බිහි වුණු හොඳ නායකයෙක් ලෙස ගරු සභාපතිතුමා ජනතාව වෙනුවෙන් සේවාවන් රැසක් ඉටු කර ඇත. සභාව සඳහා බුද්ධිමත්, අවබෝධයෙන් යුතුව කටයුතු කරන පිරිසක් තේරී පත් වූ නිසා අද වන තෙක් කිසිදු ගැටුම්කාරී තත්ත්වයක් ඇති කර නොගෙන, නිවැරදි ගමනක් යාමට අප සියලුම දෙනාට හැකි වූ බව කිව යුතුය.

සභාව තුළ පක්ෂ විපක්ෂ වශයෙන් කටයුතු කර, යම් යම් අවස්ථාවන්හිදී වාද විවාද සිදු කරන ලද්දේ ජනතාව වෙනුවෙන් කටයුතු කිරීම වෙනුවෙන් මිසක කිසිදු පෞද්ගලික අමනාපකමක් නොමැති බව කිව යුතුය. එසේ කටයුතු කිරීමේ දී යම් වැරැද්දක් වුයේ නම් ඒ සඳහා සමාව ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

තම කොට්ඨාසය තුළ සකස් කර ගැනීමට මාර්ග 02 ක් පවතින බැවින්, ඒ සඳහා මෝටර් ග්‍රේඩරය ලබා දෙන ලෙසටත්, විථි පහන් කිහිපයක් අක්‍රිය වී ඇති බැවින්, ඒවා නඩත්තු කර දෙන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

ගරු උප සභාපතිතුමා, ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා නැවත මැතිවරණය සඳහා ඉදිරිපත් නොවීම කණගාටුවට කරුණකි. එතුමන්ලා දෙපල නැවත මැතිවරණයට ඉදිරිපත් වී, සභාවට තේරී පත්ව ජනතාවට වැඩි සේවාවන් රැසක් සිදු කිරීමට හැකි දෙපලක් නිසා, ඔවුන් දෙදෙනා නොමැති වීම ලොකු අඩුවක් ලෙස පෙන්වා දිය හැකිය. නවක සභිකයෙක් වන මා හට ගරු උප සභාපතිතුමා බොහෝ දැනුම් සම්භාරයක් ලබා දී, ඉදිරි වැඩ කටයුතු සිදු කර ගෙන යාමට ලබා දුන් උපදෙස්වලට ස්තුතිය පුද කරන ලදී.

ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් අප සිදු කරන්නාවූ සේවාවන් සඳහා ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී. එසේම අප සභාවේ ලේකම්තුමිය අධ්‍යාපන අමාත්‍යාංශයේ සිට පළාත් පාලන දෙපාර්තමේන්තුවට පැමිණ අලුතින් අත්දැකීම් ලබා ගනිමින් සභාවට සිදු කරන්නාවූ සේවය අගය කළ යුතුය.

අප සභාවට පැමිණෙන මාධ්‍යවේදී, රංජිත් ඩයමන් මහතා, ඒ.ඒ. ප්‍රේමසිරි මහතා අප පුවත් නිවැරදිව වාර්තා ගත කිරීම වෙනුවෙන් එතුමන්ලාට ස්තුතිය පුද කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>**

මහා සභාව තුළ සෑම මාසයකම පාහේ දිගින් දිගටම ගොවි ජනතාවගේ ගොවි ගැටළු පිළිබඳ අදහස් දැක්වීම් සිදු විය. ගොවි ජනතාවට මතුවන ගැටළුවක් වේ නම් එය විසඳාලීමට කටයුතු කිරීම අප සතු යුතුකමකි. ගොවි ජනතාව ගොවිතැන් කරන ඉඩම් සුද්ධ කිරීමේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බාධා ඇති කිරීම් සිදු කරනු ලබන බැවින්, ගොවි ජනතාවට ගොවිතැන් කටයුතු කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙසට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

පරිත්‍යාග ලෙස ලැබුණු විදී පහන් 10 කොට්ඨාසය තුළ සවි කර ගැනීමට තිබෙන බැවින්, එය සවි කිරීම සඳහා වයර්, ස්විච් අවශ්‍ය වන බැවින්, එම විදී පහන් කිහිපය සවි කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

සභාවේ සේවය කරන සෞඛ්‍ය කම්කරුවන් සිදු කරනු ලබන්නේ මහඟු සේවයකි. නගරයේ පිරිසිදුභාවයටත්, අලංකාරයටත් ජනතාව පැසසුමට ලක් කරන්නේ අප වුවත්, එම පැසසුම අපට ලබා දෙන්නේ සෞඛ්‍ය කම්කරුවන්ගේ සේවාවයි. අප නැවත මැතිවරණයක් සඳහා යාමට පෙර සෞඛ්‍ය කම්කරුවන් ගෙන්වා ඇගයීමකට ලක් කළ යුතුය. ඔවුන් සඳහා හැකි පමණින් තිළිණයක් ලබා දීමට හැකි නම්, ඒ සඳහා මුල්‍යමය දායකත්වය මා හට ද ලබා දිය හැකි බව ප්‍රකාශ කරන ලදී.

අප නායක හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා රට ජාතිය වෙනුවෙන් වැඩ කළ විශිෂ්ඨ නායකයෙකි. තිස් වසරක යුද්ධය නිමා කිරීමම ජනතාවට ලැබුණු ලොකු නිදහසකි. නමුත් ජනතාවට නිදහස ලබා දුන් ඒ උතුම් නායකයා කළ මෙහෙවර මිනිසුන් අමතක කර ඇත. අප සියලුම දෙනාට නිදහසේ ජීවත් වීමට වටපිටාව සැකසී ඇත්තේ එතුමන් නිසාය. හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා සම්පත් රැසක් ලබා දී ඇත. ඒ අතර, ගුවන් තොටුපල, හම්බන්තොට වරාය, මාර්ග පද්ධති ආදිය සඳහන් කළ හැකිය. හම්බන්තොට දිස්ත්‍රික්කය සංවර්ධිත කිරීම සඳහා රාජපක්ෂ පවුල බෙහෙවින් දායක වී ඇත. එසේ බැලීමේ දී හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ උපන් අප ඒ සඳහා ණයගැති වනු ඇත.

අප ප්‍රදේශවල ජල, විදුලිය නොමැති කාලය තුළ ඒවා ලබා දීමට කටයුතු කරන ලද්දේ අප නායකයින් විසින්ය. මිනිසුන් තමන්ට කළ උපකාර අමතක කළද, කළගුණ දන්නා මිනිසුන් ලෙස අපට ඒවා අමතක කළ නොහැක.

ගරු සභාපතිතුමා තිස්සමහාරාම බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 44 ටම නායකත්වය ලබා දෙමින් ජනතාව සඳහා ඉමහත් සේවයක් කිරීමට ඇප කැප වී කටයුතු කර ඇත. සභාව විධිමත් සභාවක් වීමට ද බෙහෙවින් බලපා ඇත්තේ ගරු සභාපතිතුමාගේ නිවැරදි වැඩපිළිවෙලයි. ගරු සභාපතිතුමාගේ දුරදර්ශී වැඩපිළිවෙල නිසා ජනතාවට සේවාවන් රැසක් ඉටු කර දීමට හැකි වී ඇති බව සඳහන් කරන ලදී.

බොහෝ පාලන කාලයන් තුළ විවිධ සභාපතිවරු කටයුතු කළද, අප සභාපතිතුමා වැනි නිවැරදිව වැඩ කරන සභාපතිවරයෙක් මා දැක නොමැත. තම ගමට සේම, අනෙක් කොට්ඨාසයන් සඳහා ද එක සේ ගරු සභාපතිතුමා කටයුතු කර ඇති හොඳ නායකයෙකි. ඉදිරියේදීත් ගරු සභාපතිතුමා මැතිවරණයෙන් තේරී පත්ව නැවත ගරු සභාපති ලෙස තිස්සමහාරාමයට වැඩක් කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

රණකෙළිය ආර්ලිස් මාවතේ සිලින්ඩර් 02 ක් දමා සකස් කර ගැනීමට අවශ්‍ය බව දන්වා, එල්.වයි. නිමල් යන අයගේ නමින් ලිපියක් සභාවට ලබා දී ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

පක්ෂ විපක්ෂව සිටියද අප එක මවගේ දරුවන් සේ මේ දක්වා කිසිදු ගැටුමකින් තොරව කටයුතු කර ඇත. එසේම ඉදිරි මැතිවරණයෙන්ද එලෙස සමගියෙන් කටයුතු කර, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව තිස්සමහාරාමයටම ආදර්ශයක් ලබා දිය යුතු බව දන්වා සිටින ලදී.

මේ දක්වා කටයුතු කිරීමේ දී මා අතින් යම් වැරැද්දක් සිදු වුයේ නම් ඒ සඳහා සමාව අයදිමි.

ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් අප සිදු කරන්නාවු සේවාවන් සඳහා ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී.

ඇතැම් මාධ්‍යවේදීන් වැරදි වුවත් වාර්තා ගත කරමින්, යම් යම් පුද්ලයින්ට අගෞරව වන ආකාරයට කටයුතු කරයි. නමුත් අප සභාවට පැමිණෙන මාධ්‍යවේදී, රංජිත් ඩයමන් මහතා, ඒ.ඒ. ප්‍රේමසිරි මහතා අප පුවත් නිවැරදිව වාර්තා ගත කර, ගරු සභිකයින්ගේ අභිමානය රැකෙන පරිදි කටයුතු කිරීම වෙනුවෙන් එතුමන්ලාට ස්තුතිය පුද කරන ලදී.

ගරු සභාපතිතුමා, ගරු උප සභපතිතුමා, ගරු සභිකයින් මේ දක්වා ආ ගමනේ දී ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී.

ලැබුවා වු 2023 නව වසර සියලුම දෙනාට නිදුක් නීරෝගී සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>යෝධකණ්ඩිය කොට්ඨාසයේ විථි පහන් 10 ඉදිරියේ කඩිනමින් සවි කර දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.</u>

<u>සෞඛ්‍ය කම්කරුවන්ගේ පාසල් යන දරුවන් සඳහා අවශ්‍ය පාසල් උපකරණ ලබා දෙමින් අපගේ යුතුකම ඉටු කරන ලදී. වෙළඳ සංගමය සමඟ සාකච්ඡා කර, ප්‍රාදේශී සභාවේ සියලුම නිලධාරී/ සේවක මහත්ම මහත්මීන්ගේ දරුවන් සඳහා ද පාසල් උපකරණ ලබා දීමට සැලසුම් කර ඇති බව දන්වා සිටින ලදී.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ අදහස් දැක්වීම</u>

සුභ නව වසරක් ප්‍රාර්ථනා කිරීමට වඩා, සියලුම දෙනා එක්ව වසර සුභ කර ගැනීමටත්, සුභදායි රටක් ගොඩනඟා ගැනීමටත් කටයුතු කළ යුතුය. පක්ෂ විපක්ෂව දේශපාලනය සිදු කරනු ලබන්නේ අපගේ දේශපාලන දැක්ම අනුවය. එසේ නොමැතිව කිසිදු අයෙකු සමඟ පෞද්ගලික අමනාපකමක් නොමැත. අපගේ දේශපාලන දැක්ම තුළ විවේචන, මතවාද පමණක් තිබෙන බව කිව යුතුය.

ප්‍රාදේශීය සභා ධූර කාලය පිළිබඳ මේ වන විට ගැටළුකාරී තත්ත්වයක් පැන නැගී ඇත. මෙහිදී ජනතාවට ඔවුන්ගේ මතය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් ලබා දී වඩාත් සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභාවේ ගබඩාව කඩා, විශාල මුදලක බඩු නොමැති බවට කතාබහක් පවතින බවත්, මෙම කරුණ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල දක්වාම ගොස් ඇති බැවින්, එහි නිවැරදිතාවය පිළිබඳ දැන ගත යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

එසේම සභාවට අයත් බහුකාර්ය ගොඩනැගිල්ල කඩ කාමර ටෙන්ඩර් කිරීමට කටයුතු කර තිබුණද, ඒ පිළිබඳ අද වන තෙක් කිසිදු දැනුවත් කිරීමක් සිදු නොවී ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් ද විමසීම් කරන ලදී. තවද, කඩ කාමර ලබා දීම සම්බන්ධයෙන් නාම ලේඛනයක් පළාත් පාලන දෙපාර්තමේන්තුව දක්වා ගොස් ඇති බවටත් තොරතුරු දැන ගැනීමට ලැබී ඇති බැවින්, ඒ සම්බන්ධයෙන්ද විමසීම් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>බහුකාර්ය ගොඩනැගිල්ල කඩ කාමර විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුව ටෙන්ඩර් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කර ඇති බවත්, තිස්සමහාරාම ප්‍රාදේශීය සභා වෙබ් අඩවියේ පල කර ඇති බවත් දන්වා සිටින ලදී. තවද, මෙම කඩ කාමර ලබා ගැනීම සම්බන්ධයෙන් කිසිදු නාම ලේඛනයක් අප ආයතනය විසින් යවා නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.</u>

- ✓ ගබඩාව කඩා ඇති බවට දක්වන ලද අදහසේ නිවැරදි තොරතුරු දැන ගැනීම සඳහා ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභා අවස්ථාව සඳහා කැඳවූ ගබඩා භාර නිලධාරී විසින් ප්‍රකාශ කරන ලද්දේ, ගබඩාව පිරිසිදු කිරීම් සිදු කරන අවස්ථාවේ ජනේලයේ වීදුරුවක් කැඩී ඇති බව දුටු බවත්, ඒ සඳහා කළු පැහැති බැනරයක් පිටතින් ගසා ඇති බවත් නිසා ඒ බව ලේකම්තුමිය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී හා අභ්‍යන්තර විගණන නිලධාරී දැනුවත් කර, ඉන්පසුව ගරු සභාපතිතුමා ද මේ සම්බන්ධයෙන් දැනුවත් කළ පසුව, ජනේලය එසේ තැබිය නොහැකි නිසා, ගරු සභාපතිතුමාගේ උපදෙස් මත, තහඩුවක් ගසා එම ජනේලය වසා දැමීමට කටයුතු කරන ලදී. මේ සම්බන්ධයෙන් ලේඛය පරීක්ෂා කළ පසුව, ගබඩාවේ ශේෂය හා ලේඛනවල ඌනතාවයක් නොපවතින බවත්, ලේඛනවල පවතින ශේෂය අසමාන නොවන බැවින්, සොරකමක් සිදු වී ඇති බවට ප්‍රකාශයක් කළ නොහැකි බවත්, ජනේලයේ වීදුරුව කිසිවකු අතින් කුඩු වී, ඒ සඳහා බැනරයක් ආවරණය කර ඇති බව යාන්ත්‍රික වැඩපලෙහි සේවය කරන එම්. සුරංග ප්‍රදීප් මහතා විසින් ප්‍රකාශ කළ බව දන්වා සිටින ලදී.

එහිදී ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා විසින් කැඩී ඇති වීදුරුව මගින් අත දමා හෝ භාණ්ඩ රැගෙන යා හැකිද යන්න විමසන ලද පිළිතුර සඳහා ගබඩා භාර නිලධාරී විසින් අදහස් දක්වමින්, එලෙස අත දමා ඒ අසල තිබෙන දෙයක් ගැනීමට හැකි වුවත්, ඒ අසල ඇති භාණ්ඩ, ලේඛනයේ පවතින ශේෂයත් ගබඩාවේ පවතින භාණ්ඩවල ශේෂයටත් සමානව පවතින බැවින්, භාණ්ඩවල අඩුවක් පෙනී නොයන බව දන්වා සිටින ලදී.

- ✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම</u>**

මහා සභාව තුළ අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනා, ගැටළු නිලධාරීන් මගින්, අදාළ ආයතනයන් වෙත යොමු කිරීමට ගරු සභාපතිතුමා විසින් කටයුතු කළද, එම කරුණු ඉදිරිපත් කළ සභිකයින් වෙත ඒ සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා ලිපියේ පිටපතක් නොලැබෙන බැවින්, ඉදිරියේ ඒ සම්බන්ධයෙන් අපද දැනුවත් කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

අප ප්‍රදේශයේ ද මාර්ග සකස් කර ගැනීමට තිබෙන් බැවින්, ගරු සභික ආර්.කේ.එම්. රෝහිත මහතාට මාර්ග සකස් කිරීම සඳහා මෝටර් ග්‍රේඩරය ලබා දෙන අවස්ථාවේ දී මා හට ද මාර්ග සකස් කර ගැනීමට අවස්ථාවක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

2011 වසරේ සිට මා දේශපාලනය කරන අයෙකි. එම වර්ෂයේ සිටම ගරු උප සභාපතිතුමාත්, ගරු සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතාත් නියෝජනය කර ඇත. එතුමන් දෙපල නැවත මැතිවරණයක් සඳහා ඉදිරිපත් නොවන බවට දක්වන ලද අදහස කණගාටුවට කරුණකි. ජනතාව වෙනුවෙන් වැඩ කොටසක් සිදු කළ හැකි එම දෙපලට නැවතත් මැතිවරණය සඳහා පෙනී සිට ජයග්‍රහණය කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගෙවී ගිය කාලය තුළ යම් යම් මත ගැටුම් ඇති වුවත්, ඒ සියල්ලම ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමේ දී සිදු වූ කරුණු වන බවත්, කිසිදු පෞද්ගලික තරහක් එහි නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. 2018 වර්ෂයේ සිට මේ දක්වා ආ ගමන තුළ කිසිදු ගැටුම්කාරී තත්ත්වයක් ඇති කර නොගෙන සාමූහිකව කටයුතු කිරීමට සිදු වුයේ ගරු සභාපතිතුමාගේ හොඳ නායකත්වය නිසාවෙන්ය. එසේ සාමූහිකව ආ ගමන තුළ එක් මාසයක ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ නිවාස ප්‍රචණ්ඩකාරීන් විසින් කුඩු කර ගිණි බත් කර දැමීම නිසා කෝපයෙන් යුතුව කටයුතු කිරීමට සිදු වූ අවස්ථාවක් තිබුණද, එය එසේ සිදු වුයේ එතුමන්ලා එම අවස්ථාවේ සිටි මානසික තත්ත්වය නිසා බව කිව යුතුය. ඒ හැර වෙනත් කිසිදු ප්‍රශ්නයක් අප සභාව තුළ මේ දක්වා ඇති නොවී තිබීමත් සතුටු විය යුතු කරුණකි.

අප සභාවට පැමිණි දින සිට ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමට කැප වී කටයුතු කර ඇත. ඒ අතර නිරන්තරයෙන්ම ගොවි ජනතාවගේ ප්‍රශ්න, විදුලි වැට දීර්ඝ වශයෙන්ම සාකච්ඡා කළ කරුණු ලෙස පෙන්වා දිය හැකිය.

ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම හා ආශිර්වාදය මත යෝධකණ්ඩිය විදුහලේ වොලිබෝල් පිටිය සකස් කර ගැනීමට හැකි විය. ඒ වෙනුවෙන් එතුමන්ට ස්තුතිය පුද කරන ලදී.

ගරු සභාපතිතුමාටත්, ගරු උප සභාපතිතුමාටත්, ගරු සභිකයින්ටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් මේ දක්වා ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී. විපක්ෂ නායකතුමා සෑම විටකම මා සිදු කරන ලද කාර්යයන්වලදී මා සමඟ හිද උපදෙස් ලබා දෙමින් කටයුතු කිරීම වෙනුවෙන් එතුමන්ටත් ස්තුතිය පුද කරන ලදී. මේ සියලුම දෙනාට ඉදිරි මැතිවරණයෙන් තේරී පත් වීමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ජනතාව වෙනුවෙන් වැඩි සේවයක් තවත් ඉදිරියට කිරීම සඳහා නැවතත් මැතිවරණයෙන් තේරී පත්ව තිස්සමහාරාමයේ සභාපති වීමට ගරු සභාපතිතුමාට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ අදහස් දැක්වීම</u>

සියලුම දෙනාගේ සිතුම් පැතුම් ඉටු වන සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

බිලියම් රේසි යන දාර්ශනිකයා ප්‍රකාශ කර ඇත්තේ ඔබගේ සන්සුන් මනස අභියෝගවලට අවසාන කාලයයි. එම නිසා විවේක ගන්න.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම</u>

අද දින දක්වන ලද අදහස් හා සමඟ බැලීමේ දී පළමු කොට ආපසු හැරිය බැලිය යුතුය 2022, 2021, 2020, 2019 වර්ෂයන් තුළ රට තුළ ඇති වූ බාධාවන් සමඟ ප්‍රාදේශීය සභාවක් ලෙස වැඩ කටයුතු කළ ආකාරය සම්බන්ධයෙන්. එම වර්ෂයන් තුළ කුමන බාධාවන් පැමිණියත් හැකි පමණින් ජනතාවට සැහිමකට පත් වන ආකාරයේ වැඩ කොටසක් කිරීමට හැකි වී ඇත. ජනතාව බලාපොරොත්තු වූ ආකාරයේ වැඩ කොටසක් සභාවක් ලෙස අප සිදු කර ඇතිද යන්න පසු විපරමක් සිදු කිරීම සුදුසු වේ. ගිය මහා සභාවේ මේ දක්වා අප විසින් ඉටු කරන ලද කාර්යයන් Presentation එකක් මගින් අප සියලුම දෙනාට සිහිපත් කරවීමට කටයුතු කළද, ඒ සම්බන්ධයෙන් තිස්සමහාරාමයේ ජනතාව නොදනි. අප කරන වැඩසටහන් ජනතාව අතරටත් යැවීමට හැකි වන පරිදි වැඩසටහනක් සකස් කරන්නේ නම් වඩාත් යෝග්‍ය වන බව ප්‍රකාශ කරන ලදී.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් ජනතාවාදී වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී එතුමන්ගේ පක්ෂයේ සභිකයින්ගේ සහාය සේම, විපක්ෂයක් ලෙස අපෙන් ලබා දිය යුතු සහායන් ලබා දී ඇත. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයද ඔවුන්ගේ දැක්මේ සිට යම් යම් කරුණු වලදී පක්ෂ/විපක්ෂ වෙමින් සභාවේ ගමන් මාර්ගය නිවැරදි මගකට ගෙන යාමට සහාය ලබා දී ඇත. සභාවේ පෙර වර්ෂවල කෝටි 05 ට තිබූ ආදායම කෝටි 22 දක්වා වැඩි කර ගැනීම සඳහා දරණ ලද උත්සාහය වෙනුවෙන් සහ එම ඉලක්කය සපුරා ගැනීමට සියලුම දෙනාගේ සහාය ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

සභිකයෙකු ලෙස මා කටයුතු කිරීමේදී සෑම අවස්ථාවකම විමසිලිමත්ව නිවැරදිව කටයුතු කර ඇත. සභාවේ මාසික මහා සභාව, ස්ථාවර කමිටු සඳහා සහභාගී වී ගරු සභාපතිතුමා ගෙන යන වැඩපිළිවෙල නිවැරදි සිදු කිරීම සඳහා අපගේ ද අදහස් ලබා දෙමින් සෑම අවස්ථාවකම ජනතාවාදී සේවයක් ඉටු කිරීමට කැපවී කටයුතු කර ඇති බව දන්වා සිටින ලදී.

අප විපක්ෂයක් ලෙස පාලන බලයක් නොමැතිව සභා වාර 04 ක් පුරාම තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් කටයුතු කරන ලදී. මා ඇතුළු තම කණ්ඩායම එසේ කටයුතු කිරීමේ දී ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින් ඇතුළු පරිපාලනය ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී.

ප්‍රදේශයේ මංමාවත් මන්ත්‍රී ප්‍රතිපාදන මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සකස් කිරීමේදී පවතින අඩුපාඩුකම් සකසා ගනිමින් එකී සංවර්ධන කටයුතු සිදු කිරීමට ලබා දුන් සහාය වෙනුවෙන් ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින්ටත්, ලේක්ම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, තාක්ෂණ සේවා නිලධාරීන්ටත් ස්තුතිය පුද කරන ලදී.

මා ඇතුළු අප සභික කණ්ඩායම සඳහා ද විජී පහන් කට්ටල ලබා දීම වෙනුවෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන ලද අතර, එකී විජී පහන් සොර සතුරු ග්‍රහණය වැඩිව තිබූ අත්‍යාවශ්‍ය ස්ථාන සඳහා සවි කිරීමට ද කටයුතු කරන ලදී.

එසේම අප නගරය පිරිසිදු නගරයක් කිරීම සඳහා සෞඛ්‍ය කම්කරුවන් ඇප කැපවී සේවය කරනු ලබයි. ඔවුන්ගේ එම දහඩිය මහන්සියෙන් සිදු කරන සේවාව නිසා අප නගරය අද සුන්දර පිරිසිදු නගරයක් බවට පත් වී ඇත. විපක්ෂයක් සේ නොව, සියලුම දෙනා එක්ව ඔවුන් අගය කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

මීට පෙර පැවැති සෑම පාලන කාලයකම සිටි ගරු සභාපතිවරුන්ට අප සහාය දී කටයුතු කර ඇත. තිස්සමහාරාමයේ උපන් පුරවැසියෙක් ලෙස තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් ගෙන යන වැඩපිළිවෙලට අපගේ සහාය නොමදව ලබා දී ඇති බව ප්‍රකාශ කරන ලදී.

දේශපාලනය වශයෙන් විවිධ මතවාද තිබුණද, අප සභාව තුළ එක මවකගේ දරුවන් සේ එකට හිඳ කටයුතු කරන ලදී. සභිකයින් ලෙස අපගේ ගෞරවය රැකෙන පරිදිත්, තිස්සමහාරාමයේ ජනතාවගේ ගෞරවය රැකෙන පරිදිත් මේ දක්වා කටයුතු කර ඇති බව සඳහන් කළ යුතුය.

මැතිවරණයක් පැවැත්වීමට කටයුතු කරනවා යැයි ප්‍රකාශ කළද, තවම ඒ සඳහා තීන්දුවක් ලබා දී නොමැති බැවින්, ඒ දක්වාම අප ජනතාව වෙනුවෙන් කටයුතු කිරීමට බැඳී සිටින බව ප්‍රකාශ කරන ලදී.

එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් අප කටයුතු කරන ලදී. එසේ කටයුතු කිරීමේ දී දේශපාලන නායකයින් අපව දිරිමත් කර අප සාර්ථක ඉදිරි ගමනකට යොමු කරන ලදී. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා දැනට සමගි ජන බලවේගය නියෝජනය කරමින් දේශපාලනය කළද, එතුමන් ද අප ප්‍රදේශයේ කටයුතු සඳහා සහාය ලබා දී ඇති බව සිහිපත් කළ යුතුය. ගරු එතුමන් මිනිසකුගේ උපතේ සිට මරණය දක්වාම සෑම අවස්ථාවකදීම ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙමින් කටයුතු කර ඇත. ඕනෑම අවස්ථාවක ප්‍රදේශයේ මරණයක් සිදු වූ පසුව, ඒ පිළිබඳව දැනුවත් කළ පසු ඒ සඳහා සම්බන්ධ වී කළ හැකි උපකාරයන් සිදු කර ඇති බවත්, එලෙස සිදු කරන්නා වූ සේවාවන් වෙනුවෙන් එතුමාට ප්‍රණාමයත්, ගෞරවයත් පුද කළ යුතු බව සඳහන් කරන ලදී.

එසේම ගරු දිලීප් වෙදආරච්චි මැතිතුමා ද අප ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සහයෝගයන් ලබා දී ඇති බවත්, එතුමා ද ප්‍රදේශයේ මළ ගෙදරක් වූ පසුව ඒ සම්බන්ධයෙන් දැන් වූ විගස කළ හැකි උපකාරයන් සිදු කිරීමට කටයුතු කිරීම වෙනුවෙන් එතුමන්ටත් ස්තුතිය පුද කරන ලදී.

දේශපාලන දිවියේ ගරු චමල් රාජපක්ෂ මැතිතුමා හොඳ නායකයෙක් ලෙස එතුමන් අගය කළ යුතුය. මව්ආර ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී අප රටේම ඉංජිනේරුවන්ගේ සහාය ලබා ගනිමින් එය සකස් කිරීමට කටයුතු කරන ලදී. ජලය ලබා ගැනීමට නොහැකිව යායවල් 04-05 ක කුඹුරු ගොවිතැන් කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී තිබූ කාලයක, අට්ටික්කාව අමුණ සකස් කරමින්, කුඹුරු ගොවිතැන් කිරීම සඳහා ගොවි ජනතාව අවස්ථාව ලබා දී ඇත. මෙකී කරුණු දෙස බැලීමේදී ගරු චමල් රාජපක්ෂ මැතිතුමා ගොවි ජනතාව ගැන සිතන ගොවි ජනතාවට ආදරය කරන නායකයෙක් ලෙස සඳහන් කළ හැකිය.

නැවත මැතිවරණයක් පැවැත්වුවහොත්, දැනට ඉන්න ගරු සභිකයින් සියලුම දෙනාට නැවතත් තේරී පත් වී පැමිණීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී. ගරු උප සභාපතිතුමා, ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා නැවත මැතිවරණය සඳහා ඉදිරිපත් නොවීම කණගාටුවට කරුණකි.

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය මේ දක්වා ලබා දුන් සහායට ස්තුතිය පුද කර සිටින බවත්, එම සියලු දෙනාට සුභ නව වසරක් ප්‍රාර්ථනා කරන අතර, සියලුම දෙනාට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරන ලදී.

2023 වසර හේන් ගොවි බිම් සරු කර ගත හැකි ගොවියා ශක්තිමත් කළ හැකි සාර්ථක වසරක් වේවායි ප්‍රාර්ථනා කරන අතර, ගරු සභාපතිතුමාට සුභාශිංසන එක් කරන ලදී.

❖ **<u>ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතාගේ අදහස් දැක්වීම</u>**

සභාවක් ලෙස අප කටයුතු කිරීමේ දී රාජ්‍ය අංශ සේම පෞද්ගලික අංශවලින් ද ලබා දුන් සහායට ස්තුතිය පුද කළ යුතුය. මැතිවරණයක් පැමිණීමට ද හැකිය. යම් හෙයකින් දීර්ඝ විය ද හැකිය. මා 1991 වර්ෂයේ දී මැතිවරණය සඳහා ඉදිරිපත් වූයේ අකමැත්තෙන් වුවත්, එම මැතිවරණය ජයග්‍රහණය කරමින් සභිකයෙක් ලෙස ජනතාව වෙනුවෙන් කටයුතු කරන ලදී. එම කාලය තුළ අප ප්‍රදේශයේ තුළ විදුලිය නොමැති වීමෙන් ආලෝකය ලබා ගන්නා ලද්දේ කුප්පි ලාම්පුවෙන්ය. මා දේශපාලනයට පිවිසීමත් සමඟ අප නායකයින් සමඟ සාකච්ඡා කර, අප ප්‍රදේශයට විදුලිය ලබා ගැනීමටත්, මාර්ග පද්ධතිය සකස් කර ගැනීමටත් කටයුතු කරන ලද අතර, නායකයින්ගේ එම ඇසුර නිසා ගමට සංවර්ධනයක් සිදු කළා මිසක, අපට කිසිදු වාසියක් ලබා නොගත් බව සඳහන් කළ යුතුය.

මා නිරන්තරයෙන් ජනතාව වෙනුවෙන් සේවයක් සිදු කළ නිසාම මා 2011 වසරේත්, 2018 වසරේත් ජනතාව තෝරා පත් කර ගන්නා ලදී. ගම්වල බොහෝ පිරිසක් මා හට නැවතත් දේශපාලනයට පිවිසෙන ලෙසට ඉල්ලීම් කරනු ලැබුවද, මාගේ පෞද්ගලික හේතුවක් මත මා නැවත මැතිවරණය සඳහා ඉදිරිපත් නොවීමට තීරණය කරන ලදී. නමුත් ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමට අවශ්‍ය වන සෑම අවස්ථාවකම මාගේ සහාය ලබා දෙන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

දේශපාලනයට පිවිසි දින සිට අද දක්වාම කිසිදු ගැටුමක් ඇති කර නොගනිමින් කටයුතු කර ඇත. යම් හෙයකින් වාද විවාදයක් වූයේ නම්, එය ජනතාව වෙනුවෙන් කතා කිරීමට මිසක, පෞද්ගලික තරහක් පිරිමසා ගැනීමට නොවන බවත් දන්වන ලදී.

ඉදිරි මැතිවරණයක් පැමිණියහොත් සියලුම දෙනාට ඒ සඳහා පෙනී සිට ජය ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී. මේ දක්වාම ජනතාව වෙනුවෙන් සිදු කළ යුතු දේ ජනතාවගේ හදවත් හි ඇත. එයද අපට සතුටක් බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභපතිතුමා විසින් දැඩි උත්සාහයක් ගෙන අද දින සභාව පැවැත්වීමට කටයුතු කරන ලද්දේ මේ දක්වා ආ ගමන තුළ ආයතනයේ නිලධාරී/ සේවක මහත්ම මහත්මීන් ලබා දුන් සහාය ස්තුතිය පුද කිරීමට බවත්, එය ඉතාමත් හොඳ ක්‍රියාවක් බවත් සඳහන් කරන ලදී.

ලැබුවා වූ 2023 වර්ෂයට සියලුම දෙනාට සුභ පැතුම් එක් කරන ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>**

අද දින මහා සභාව තුළ අවසන් වන තෙක් රැදී සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු සියලුම ගරු සභිකයින්ටත්, මාධ්‍යවේදී මහතාටත්, ලේකම්තුමිය ඇතුළු නිලධාරී මහත්මියටත් ස්තුතිය පුද කරන ලදී.

සභාව තුළ දේශපාලන කඳවුරු 04 කින් සභිකයින් නියෝජනය කළද, අප සභාව තුළ පාට පක්ෂ නොබලා සියලුම දෙනා එකට එක්ව කටයුතු කිරීම සම්බන්ධයෙන් සතුටු විය හැකිය.

පළාත් පාලන මැතිවරණය රටක් පෙරලන මැතිවරණයක් නොවේ. ගමේ ජනතාව ගමේ නියෝජිතයාට ඡන්දය ලබා දීම සිදු කරයි. දේශපාලනය තුළ යම් වෙනසක් කිරීමට නම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය ජය ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

අප පාලනය භාර ගත් දින සිට රට තුළ නොයෙකුත් බාධාවන් ඇති වුවත් එම බාධා සියල්ල ජය ගෙන ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමට හැකි වීම පිළිබඳ සතුටු විය යුතුය. කොරෝනා වසංගත තත්ත්වය රට පුරාම ව්‍යාප්ත වූ කාලය තුළ මරණ සංඛ්‍යාව වැඩි වීම හේතුවෙන් අප අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රටේ ජනතාවගේ ජීවිත බේරා ගැනීම සඳහා එන්නත් ගෙන්වා රටේ සියලුම ජනතාවට එන්නත් ලබා දීම සිදු කරන ලදී. එලෙස එන්නත් ගෙන්වා ජනතාවට එන්නත් ලබා දී මෙම රෝගයෙන් බේරා ගත් පසුව, රටේ ජනතාවට ඒ කිසිවක් මතකයේ නොමැති වීමත් කණගාටුවට කරුණකි.

තවද, එන්නත්කරණ වැඩසටහන සිදු කරන අවස්ථාවේ දී ඒ සඳහා සම්බන්ධ වන නිලධාරීන්ට ආහාරපාන ලබා දීම, නිරෝධායනය වන පවුල් සඳහා බඩු මලු ලබා දීම, ග්‍රාම සේවා වසම් 44 හි නිවසට වී සිටින ජනතාව සඳහා වියළි ආහාර මලු සහන මිලට ලබා දීම, කෙරෝනා අසාධිතයින්ට රජයෙන් ලබා දෙන වියළි ආහාර මලු ප්‍රමාද වීම මත සභාවෙන් එම පිරිස සඳහා බඩු මලු ලබා දීම ආදී විශාල සේවා රැසක් සභාවක් ලෙස අප විසින් සිදු කරන ලදී.

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව හේතුවෙන් අප නිවාස කුඩු කර ගිණි බත් කර දැමීමේ සිදුවීමට සම්බන්ධ කර ගත් පාසල් ළමුන් බේරා ගෙන, මහමොලකරුවන් හට දඩුවම් ලබා දීමට ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, මා සහ ගරු සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා පෙනී සිට කටයුතු කිරීමට ඉදිරිපත් වන බව ප්‍රකාශ කරන ලදී. දේශපාලනය කිරීමේ දී කුහකකම් සිදු නොකර, සිදු කරන දේශපාලනය නිවැරදි කළ යුතුය.

අප සියලුම දෙනා නිවැරදි වැඩපිළිවෙලක් ගෙන යන නිසා, සාර්ථක ඉදිරි ගමනක් යාමට හැකි වී ඇත. පක්ෂ විපක්ෂ සියලුම දෙනා අප සිදු කරන්නා වු වැඩපිළිවෙල සඳහා ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී.

මහා සභාවේ සම්මත කර දෙන ලද සෑම යෝජනාවක්ම ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට ඒ වෙනුවෙන් ඇප කැප වී කරන සේවයට ස්තුතිය පුද කරන ලදී.

අප සභාවට සහභාගී වන මාධ්‍යවේදී රංජිත් ඩයමන් මහතාටත්, ඒ.ඒ. ප්‍රේමසිරි මහතාටත් අප පුවත් කිසිදු හානියක් නොවන පරිදි නිවැරදිව වාර්තා ගත කිරීම වෙනුවෙන් ස්තුතිය පුද කරන ලදී.

දේශපාලනය වශයෙන් කඳවුරු තිබුණද, අප සියලුම දෙනා සාමූහිකව එක පවුලක් සේ හිද කටයුතු කළ යුතුය. සභාපති ලෙස මා කිසිදු සභිකයෙක් හට හානියක් වන ආකාරයේ කිසිදු දෙයක් වීමට ඉඩ නොදෙනු ඇත. අප සියලුම දෙනා එකිනෙකා ආරක්ෂා වන පරිදිත්, එකිනෙකාගේ ගෞරවය රකෙන පරිදිත් කටයුතු කිරීමට වගබලා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

ලැබුවා වූ 2023 නව වසර සියලුම දෙනාට නිදුක් නීරෝගී සාර්ථක ජයග්‍රාහී සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

තවද, මීළඟ මහා සභාව 2023 පෙබරවාරි මස 08 වන දින පෙ.ව. 10.00 ට පැවැත්වීමට කටයුතු කරන බව සියලුම දෙනාට දන්වා සිටින ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, මාධ්‍යවේදී ඒ.ඒ. ප්‍රේමසිරි මහතා හා අසිත මහතාටත් ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 04.30 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2023.01.09 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.